පළමු කාණ්ඩය - පළමු කලාපය

2013 අප්‍රේල්

# ශ්‍රී ලංකාවේ මානව හිමිකම්

ASIAN HUMAN RIGHTS COMMISSION

ප්‍රකාශනය

ආසියානු මානව හිමිකම් කොමිසම

**ඉදිරි වසරවලදී ලෝකය ශ්‍රී ලංකාව ගැන කුමක් දැනගනු ඇතිද? 2**

*එළඹෙන මාස කිහිපයේදී ලෝකය දැනගනු ඇත්තේ, ස්වාධීන සහ අපක්ෂපාතී ආයතනයක් මගින් පවත්වන සාධාරණ සහ විශ්වාසනීය පරීක්ෂණයක් සඳහා අගවිනිසුරුවරියටවත් අයිතියක් නැති රටක අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සහ මානුෂීය නීතිය උල්ලංඝනය වීම් ගැන විමර්ශන පැවැත්වීම වනාහී මනෝරාජ්‍යයක හිතලුවක් පමණක් වන බවයි.*

**මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ ශ්‍රී ලංකාව 5**

*ශ්‍රී ලංකාව කුමාරයෙකු හෝ කුමාරියක යැයි මානව හිමිකම් කවුන්සිලය සිතයි. නමුත් ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් ගෙම්බෙකු බවට පත්ව සිටියි.*

**පව් පින් සේ රසවිඳීම 7**

**ළමුන් මරා දැමීම සහ ශ්‍රී ලංකාවේ ලේ වැකුණු උරුමය 10**

**ජා ති ක ආ ර ක් ෂා ව 14**

**මළ මිනිස්සු බොරු නොකියති (මාතලේ සමූහ මිනීවළ පිළිබඳ)15**

**ඇය ඔබව සොයන්නීය 17**

**මෙහෙව් රටක් 19**

**එදා සහ අද 21**

**"අප තිදෙනා බලාගන්න" - දහසය වසරක් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවය කළ අගවිනිසුරුවරියකගේ ආයාචනය 22**

**අද, 1978 ආණ්ඩු ක්‍රමයේ අරමුණ ඉෂ්ට සිද්ධ වූ දිනයයි 26**

*සංස්කරණ උපදේශකත්වය*



බැසිල් ප්‍රනාන්දු

Asian Human Rights Commission Ltd.
Unit 701A, Westley Square
48 Hoi Yuen Road
Kwan Tong, KLN
Hong Kong, China
Tel: +(852) 2698 6339
Fax: + (852) 26986367
Web: humanrights.asia

| | | | | | |
|---|---|---|---|---|---|
| අදෘශ්‍යමාන මුද්ද පිළිබඳ ග්ලව්කන්ගේ කතාන්දරය සහ ජේ.ආර්. ජයවර්ධනගේ බුද්දලය — 30 | ශ්‍රී ලංකාව විවාදයන් රහිත බිමකි — 34 | පරමාධිපත්‍යයක් නැති ජනතාවක් — 40 | යුද්ධයේ ලේ වැකුණු උරුමය — 43 | රිසානා නෆීක් අංක 1 සහ අංක 2 — 45 -46 | What Men Live By ලියෝ තෝල්ස්තෝයි කෙටිකතාව — 48 |



# ඉදිරි වසරවලදී ලෝකය ශ්‍රී ලංකාව ගැන කුමක් දැනගනු ඇතිද?

- බැසිල් ප්‍රනාන්දු විසිනි

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකාවේ සංහිඳියාව සහ වගවීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යෝජනාව සම්මත කළේය. යෝජනාවේ සාරාංශය වන්නේ ශ්‍රී ලංකාවේ සංහිඳියාව හා වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවට තාක්ෂණික සහයෝගය සහ උපදෙස් ලබාදීම සම්බන්ධ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ වාර්තාව මානව හිමිකම් කවුන්සිලය විසින් සාදරයෙන් පිළිගන්නා බව සහ මහ කොමසාරිස් කාර්යාලය විසින් නිකුත් කළ වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කවුන්සිලය ශ්‍රී ලංකා ආණ්ඩුව දිරිමත් කරන බව මෙන්ම අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සහ අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් පවතින චෝදනා පිළිබඳ විශ්වාසනීය විමර්ශන පවත්වන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින බව ය.

අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ සහ අන්තර්ජාතික මානුෂීය නීතියේ උල්ලංඝනයන් සම්බන්ධ චෝදනා පිළිබඳ ශ්‍රී ලංකාව දැනුවත්ව සිටීම මෙහිදී අවශ්‍ය වේ. චෝදනා පිළිබඳ ආණ්ඩුව දැනුවත් වීමට නම්, ඉදිරිපත් කිරීමට චෝදනා තිබෙන පුද්ගලයන් ට ආණ්ඩුව වෙත ගොස් එම චෝදනා ඉදිරිපත් කළ හැකි වාතාවරණයක් ආණ්ඩුව විසින් සැකසිය යුතු වේ. බිය නොව විශ්වාසය පැතිර පවත්නා සමාජ හුරුවේ වෙනසක් ආණ්ඩුව විසින් සකස් කළ යුතු බව එයින් අදහස් කරයි. ලෝකය ඉදිරි මාස වලදී දැනගනු ඇත්තේ එබඳු වාතාවරණයක් ශ්‍රී ලංකාවේ නොපවතින බවයි. තවද එබඳු චෝදනාවක් නැගීමට නිර්භය වන ඕනෑම පුද්ගලයෙකු විසින් ඔහුගේ හෝ ඇයගේ ජීවිතය අනතුරේ හෙළාගනු ඇති බවයි. ශ්‍රී ලංකාව තුළ ජීවත්වන්නවුන් ඉතා හොඳින් දන්නා තත්වය එයයි. තවදුරටත් ජීවතුන් අතර නැති හෝ සිය ජීවිතය රැක ගැනීම සඳහා රටෙන් පළාගිය සංඛ්‍යාව අති

මහත් ය. මෙබඳු වාර්තා ගණනාවක් ගැන ලෝකය අසා ඇති නමුත් ඒවා ව්‍යාතිරේඛ හෝ අතිශයෝක්ති ලෙස ඇතැම්විට සැලකෙයි. නමුත් මෙම යෝජනාව රඳා පවතින්නේ මිනිසුන් ඉදිරියට පැමිණ චෝදනා ඉදිරිපත් කිරීම මත නිසා ආණ්ඩුවට හෝ එහි නියෝජිතයන්ට එරෙහිව එබඳු චෝදනා ඉදිරිපත් කළ හැකි වාතාවරණයක් ශ්‍රී ලංකාව තුළ පවතින්නේදැයි පරීක්ෂා කර බැලීම ලෝකයට අසීරු නොවනු ඇත. දේශීය ජනයා අත්දකින සහ ඉතා හොඳින් දැන සිටින භීතිය වටහාගැනීමට හා අගය කිරීමට ලෝකයට දැන් අවස්ථාවක් ලැබෙනු ඇත. ආණ්ඩුව දැනටමත් ලබාදෙන නිදහසට කාරණය වන, අපට කිසිවෙක් ඍජු ලෙස පැමිණ චෝදනා නොකරති සහ ඒ අනුව කිසිවෙකුට චෝදනා නැති බවට එය සාක්ෂි දරයි යන්නට ලෝකය ඇහුම්කන් දෙනු ඇත. භීතිය විසින් මෙහෙයවනු ලබන නිශ්ශබ්දතාවය නිර්දෝෂී බවේ සාක්ෂිය ලෙස යොදාගැනේ. ලෝකය එළඹෙන මාස කිහිපයේදී දකිනු ඇත්තේ එයයි.

ආණ්ඩුව දැනටමත් ලබාදෙන නිදහසට කාරණය වන, අපට කිසිවෙක් ඍජු ලෙස පැමිණ චෝදනා නොකරති සහ ඒ අනුව කිසිවෙකුට චෝදනා නැති බවට එය සාක්ෂි දරයි යන්නට ලෝකය ඇහුම්කන් දෙනු ඇත. භීතිය විසින් මෙහෙයවනු ලබන නිශ්ශබ්දතාවය නිර්දෝෂී බවේ සාක්ෂිය ලෙස යොදාගැනේ. ලෝකය එළඹෙන මාස කිහිපයේදී දකිනු ඇත්තේ එයයි.

ස්වාධීන සහ විශ්වාසනීය විමර්ශනයක් පැවැත්වීම සඳහා ද යෝජනාව මගින් ශ්‍රී ලංකාව බැඳ තබයි. චෝදනා සම්බන්ධයෙන් ස්වාධීන හෝ විශ්වාසනීය විමර්ශන පැවැත්වීමට සමත් වන අපරාධ යුක්තික ක්‍රමයක් ශ්‍රී ලංකාවේ නොපතින බව ද ලෝකය දැනගනු ඇත. අද වන විට හමුදාව, පොලීසිය හෝ පැරා මිලිටරි භටයන් විසින් අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සහ මානුෂීය නීතිය උල්ලංඝනය කරනවා පමණක් නොව එකී උල්ලංඝනයන් විමර්ශනය නොකර හැරීම ද සිදුවෙයි. මිනීමැරුම, ස්ත්‍රී දූෂණය, සොරකම හා අයුතු අත්පත් කර ගැනීම වැනි සාමාන්‍ය අපරාධ සම්බන්ධයෙන් පවා ස්වාධීන සහ විශ්වාසනීය විමර්ශන ක්‍රමයක් ශ්‍රී ලංකාවේ නැත. ස්වාධීනත්වය පිළිබඳ සංකල්පයට තිබූ තැන දේශපාලනීකරණය විසින් අත්පත්කර ගෙන තිබේ. දේශපාලනීකරණය යන්නෙන් අදහස් කරන්නේ පොලීසිය හෝ වෙනත් විශේෂ නියෝජිත ආයතන වැනි විමර්ශන ආයතන සම්පූර්ණයෙන්ම දේශපාලනඥයන්ගේ පාලනය යටතේ පවතින බවයි. එයින් අදහස් වන්නේ පොලීසියට සහ සෙසු නියෝජිත ආයතනවලට දේශපාලනඥයන්ගේ අධිකාරියෙන් තොරව කිසිදු චෝදනාවක් විමර්ශනය කළ නොහැකි බවයි. වඩාත් නිවැරදි ලෙස පවසන්නේ නම් විමර්ශන නැවැත්වීමට හෝ අපරාධකරුවන් නිදහස් විය හැකි පරිදි පරීක්ෂණය විෂය මූලිකව හෝ අපක්ෂපාතී ලෙස නොපවත්වන්නැයි විමර්ශකයන් ට නියෝග කිරීමට ආණ්ඩුවට හැකිය. රට තුළ ජීවත්වන්නන් මේ බව ඉතා හොඳින් දන්නා අතර ඉදිරි මාසවලදී ලෝකයට මේ තත්වය සියැසින් දැකීමට අවස්ථාව ලැබෙනු ඇත.

විශ්වාසනීය විමර්ශනයන් යන්නෙන් අදහස් වන්නේ විමර්ශකයන් විසින් අපරාධ විමර්ශනයේදී අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන ප්‍රමිතීන් හා නියමනයන් අනුගමනය කිරීමයි. ශ්‍රී ලංකාවේ සිදුකෙරුණු එබඳු විශ්වාසනීය විමර්ශනයක් මතකයේ පවා තිබේද යන්න සැක සහිත ය. අතිශය අබිරහස් සහ අසීරු සිදුවීම් පිළිබඳ විමර්ශන පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසියට සහ වෙනත් නියෝජිත ආයතනවලට දිදුළන කීර්තියක් තිබූ සමයක් ද විය. කෙසේ නමුත් ගතවූ දශක හතරකට ආසන්න කාලයකදී මෙම කීර්තිය නැති වී ගොස් ඇති අතර විමර්ශන සිදුවන්නේ කෙතරම් හාස්‍යජනක ලෙසදැයි දේශීය ජනයා දනිති. සන්ඬේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය සහ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර වැනි මහ දවාලේ සිදුවූ ඉතා ප්‍රකට ඝාතනවලදී පවා ඉහළ

පෙළේ පොලිස් නිලධාරීන් වාර්තා එකකට පසුව තවෙකක් බැගින් පුරවමින්, සියලු ආකාරවල නිදහසට කරුණු දක්වමින්, ඇත්ත වශයෙන් කියතොත් විශ්වාසනීය විමර්ශන පැවැත්වීම සිය බලය තුළ තවදුරටත් කළ නොහැකි දෙයක් බව ඔප්පු කරමින් සිටිති. ශ්‍රී ලංකාවේ සිදුවන අපරාධ සම්බන්ධයෙන් විශ්වාසනීය විමර්ශන පැවැත්වීම, අශ්වයාගෙන් බිත්තර බලාපොරොත්තු වීමක් වැනි ය.

**කෙටියෙන් පවසන්නේ නම්, එළඹෙන මාස කිහිපයේදී ලෝකය දැනගනු ඇත්තේ, ස්වාධීන සහ අපක්ෂපාතී ආයතනයක් මගින් පවත්වන සාධාරණ සහ විශ්වාසනීය පරීක්ෂණයක් සඳහා අගවිනිසුරුවරියටවත් අයිතියක් නැති රටක අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සහ මානුෂීය නීතිය උල්ලංඝනය වීම් ගැන විමර්ශන පැවැත්වීම වනාහී මනෝරාජ්‍යයක හිතලුවක් පමණක් වන බවයි.**

විශ්වාසනීය විමර්ශන සඳහා පොලිස් නියෝජිතායතන එකිනෙක අතර සහයෝගිතාව පමණක් නොව නීතිපති දෙපාර්තමේන්තුව සමග සහයෝගිතාව ද අවශ්‍ය බව ය. නමුත් නීතිපති දෙපාර්තමේන්තුව පාලනය වන්නේ ජනාධිපති ලේකම් විසින් වන අතර මෙම දෙපාර්තමේන්තුවට ආණ්ඩුවට එරෙහිව කිසිදු පියවරක් ගත නොහැකි බව දේශීය ජනයා ඉතා හොඳින් දනිති. තවද මෙය දීර්ඝ වශයෙන් කතාබහට ලක්වී තිබෙන මාතෘකාවකි. එම දෙපාර්තමේන්තුවට ද දිදුළන අතීතයක් තිබූ නමුත් එහි වර්තමානය නම් විමර්ශන ආයතන මෙන්ම ගොහොරුවකි.

කෙටියෙන් පවසන්නේ නම්, සම්මත කර ගත් යෝජනාව මගින්, දේශීය ජනයා දීර්ඝ කාලයක් මුලුල්ලේ අත්විඳිමින් සිටින දෙය දෙස බැලීමට ලෝකයට අවස්ථාවක් ලැබෙනු ඇත. සාමාන්‍ය අපරාධ සඳහා පවා දැන් අපරාධ යුක්තික ක්‍රමය ක්‍රියාත්මක නොවන්නේ හමුදාවට එරෙහිව චෝදනා කිරීම සහ පොලීසිය, පැරාමිලිටරි සහ රහස් ඔත්තු සේවා ඒජන්සිවලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම ඉහළින් කෙළින්ම ලැබෙන උපදෙස් මත සිදුනොවී පවතින්නට ඉඩ හරිමිනි.

අපරාධ යුක්තිය පසිඳලීම සඳහා පවතින ප්‍රධානමත බාධාවන් උද්ගත වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බව ද ලෝකය දැනගනු ඇත. විධායක ජනාධිපතිවරයාව නීතියට ඉහළින් තැබූ සහ අධිකරණය හා පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාට අප්‍රධාන කළ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් රටේ සියලුම මහජන ආයතන අකර්මණ්‍ය කර තිබේ. එම ප්‍රකාශය අතිශයෝක්තියක් යැයි ලෝකය සිතනු ඇති නමුත් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන ද 18 වැනි සංශෝධනය ගැන ද කතාව දේශීය ජනයා දනිති. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්ම නොපනත්කම නිර්මාණය කරන විට රටකට කුමක් සිදුවේදැයි සොයාබැලීමට අවස්ථාවක් පමණක් නොව යුතුකමක් ද ලෝකයට දැන් තිබේ.

කෙටියෙන් පවසන්නේ නම්, එළඹෙන මාස කිහිපයේදී ලෝකය දැනගනු ඇත්තේ, ස්වාධීන සහ අපක්ෂපාතී ආයතනයක් මගින් පවත්වන සාධාරණ සහ විශ්වාසනීය පරීක්ෂණයක් සඳහා අගවිනිසුරුවරියටවත් අයිතියක් නැති රටක අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සහ මානුෂීය නීතිය උල්ලංඝනය වීම් ගැන විමර්ශන පැවැත්වීම වනාහී මනෝරාජ්‍යයක හිතලුවක් පමණක් වන බවයි.

# මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ

# ශ්‍රී ලංකාව

\- **බැසිල් ප්‍රනාන්දු විසිනි.**

ගෙගම්බෙක් කුමාරයෙක් බවට පත්වන ආකාරය සහ ලස්සන කුමාරිකාවක් අවලස්සන මැහැල්ලක බවට පත්වන ආකාරය වැනි පරිවර්තනයන් ගැන මිත්‍යා කතාන්දරවලදී අපට නිතර අසන්නට ලැබේ. තනි පුද්ගලයන්ගේ ජීවිතවල මෙන්ම සමාජයේ ද සිදුවන පරිවර්තනයේ සංසිද්ධිය මේ කතාන්දරයන්ගෙන් විදහා දැක්වේ. ශ්‍රී ලංකාව පිළිබඳ කතා කරන විට ද මේ හා සමාන පරිවර්තනයන් රැසක් අපට පෙනේ. දශක කිහිපයකට පෙර ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රටක් විය. දැන් එය ප්‍රජාතන්ත්‍රවාදී රටක් නොවේ. ඉතාම ප්‍රාථමික පරිවර්තනයක් එහි සිදුවී තිබේ.


*තමන්ට එරෙහිව එල්ල වන ඕනෑම චෝදනාවක් ප්‍රතික්ෂේප කිරීමේ ශ්‍රී ලංකාවේ ලෙහෙසි පිළිවෙත සහ පරිවර්තනය පිළිබඳ ලේඛකයා මෙහිදී විචාරාත්මකව සලකා බලයි.*

අගවිනිසුරුවරිය වන ආචාර්ය ශිරානි බණ්ඩාරනායක අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම ඉදිරියට කැඳවීම තුළ ද මෙබඳු පරිවර්තනයක් සිදුවන අයුරු පෙනේ. අගවිනිසුරුවරිය ඉවත්කිරීමේදී අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන පිළිගත් සම්මතයන් සහ ප්‍රමිතීන් අනුගමනය නොකර ආණ්ඩුව කුමක් කළේදැයි ලෝකය ප්‍රශ්න කරමින් සිටියි. තමන් තවමත් නීත්‍යානුකූල අගවිනිසුරුවරිය බව ඇය විසින්ම ප්‍රසිද්ධියේ කියා සිටින්නීය. දේශීය සහ අන්තර්ජාතික වශයෙන් මහජනතාවගේ සිත් තුළ ඇගේ ප්‍රතිරූපය අපරාධකාරියක බවට පරිවර්තනය කිරීමට ආණ්ඩුවට අවශ්‍ය ව තිබේ.

පරිවර්තනයේ මෙකී සංසිද්ධිය වටහාගැනීම, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ ශ්‍රී ලංකාවට සිදුවන දෙය අවබෝධ කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වෙයි. වඩා විධිමත් ලෙස පවසන්නේ නම්, ශ්‍රී ලංකාව ද වෙනත් ඕනෑම සාමාජිකයෙකු හා සමාන වන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙකි. එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය තුළ, පාලනය සම්බන්ධයෙන් යම් නිශ්චිත පරමාදර්ශයන් සහ අදහස් පිළිගැනීමට අපේක්ෂිත ය. එක් එක් ආණ්ඩු විසින් සිය පුරවැසියන් ට, මානව හිමිකම් සහිත පුද්ගලයන් ලෙස සලකනු ඇත යන්න එම පරමාදර්ශයන් අතර වේ. මෙකී අයිතිවාසිකම් එක්සත් ජාතීන්ගේ සම්මුතීන් මගින් ගණන් ගැනේ.

ශ්‍රී ලංකාව කුමාරයෙකු හෝ කුමාරියක යැයි මානව හිමිකම් කවුන්සිලය සිතයි.

නමුත් ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් ගෙම්බෙකු බවට පත්ව සිටියි.






සාමාජිකයන් අතර එකගතාවය මගින් එක්සත් ජාතීන්ගේ සංවිධානය ද, සාමාජික රාජ්‍යයන්ගේ මෙකී අයිතිවාසිකම් සුරකින අයුරු නිරීක්ෂණය කිරීම සමාලෝචනය සම්බන්ධයෙන් ක්‍රමයක් සකස් කර ඇත. මේ සෑම සමාලෝචනයක් ම පදනම් ව ඇති උපකල්පනය වන්නේ, සැලකිය යුතු උල්ලංඝනයක් සිදුවී ඇත්නම්, ඕනෑම සාමාජික රාජ්‍යයකින් ප්‍රශ්න කිරීම ට සෙසු සාමාජිකයන් ට අයිතිය තිබෙනා බවයි. මේ අතර ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය තුළ මූලික පරිවර්තනයක් සිදුව තිබේ. ආණ්ඩුව සිය පුරවැසියන් ට, මූලික මානව අයිතිවාසිකම් ඇති පුද්ගලයන් ට සේ තවදුරටත් සලකන්නේ නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ක්‍රමය සැකසී තිබෙන්නේ මෙකී අයිතිවාසිකම් අදාල නැති දේ සේ සැලකීමට ය. පැමිණිලි කිරීම සඳහා මූලික ක්‍රමයක් සකස් කිරීම, පැමිණිලි විමර්ශන කිරීම සහ බරපතළ උල්ලංඝනයන් සිදුවී ඇතැයි විශ්වාස කිරීමට පදනමක් ඇති විට අධිකරණය ඉදිරියේ උල්ලංඝකයන් ට විරුද්ධ ව චෝදනා විභාග කිරීම සහ ඔවුන්ට දඬුවම් ලබාදීම ඕනෑම රටක මානව හිමිකම් පැවතීමට නම් තිබිය යුතු අවශ්‍යතා සේ සලකයි. ශ්‍රී ලංකාව පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාවේ ක්‍රමය දැන් බොහෝ සෙයින් පරිවර්තනයට ලක්ව ඇති අතර එබඳු විමර්ශනයන් පැවැත්වීමට හෝ අභිචෝදනයන් සිදුකිරීමට ආණ්ඩුවේ පැත්තෙන් දැන් බැඳීමක් නැත.

2012 වර්ෂයේදී මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කළ රෙගුලාසිය තමන් ප්‍රතික්ෂේප කරන බව සහ යෝජනා වී තිබෙන රෙගුලාසිය ද මේ හා සමානව තමන් විසින් ප්‍රතික්ෂේප කරන බව ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රකාශ කරන්නේ මේ පරිවර්තනයේ පදනම මත පිහිටා ය. රෙගුලාසිය පදනම් වන්නේ ශ්‍රී ලංකාව සාමාජික රාජ්‍යයක් වශයෙන් සිය පුරවැසියන්ගේ අයිතිවාසිකම් වලට සම්බන්ධිත බැඳීම් පිළිගන්නා බවට වන උපකල්පනය මත ය. කෙසේ නමුත් ශ්‍රී ලංකා බලධාරීන් ට අදාළ ව නම්, මෙය කිසිදු ආකාරයක ගැටලුවක් නොවේ.

මෙකී රෙගුලාසි ප්‍රතික්ෂේප කිරීම වෙනුවෙන් සියලු ආකාරවල අලංකාරෝක්ති යොදාගන්නා නමුත් සැබෑ හේතුව වන්නේ පුරවැසියන්ට එකී අයිතිවාසිකම් තිබේද හෝ නොතිබේද යන්න ඔවුන්ගේ

දෙයක් වන අතර මානව හිමිකම් කවුන්සිලයේ හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල්, පුරවැසියන්ගේ අයිතීන්ට ගරුකිරීමේ මිනුම්දණ්ඩ මත පදනම් නොවිය යුතු බවයි.

මෙය සැබවින්ම මිත්‍යා කතාන්දර වලදී ඔබට දැකිය හැකි වන ආකාරයේ තත්වයකි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාවෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද සහ යථාර්ථය කුමක් ද යන්න අතර සැලකිය යුතු වෙනසක් තිබේ. එය පිළිගත් පරමාදර්ශීන් සහ ඒවායේ ක්‍රියාකාරිත්වය අතර වෙනස පිළිබඳ ගැටලුවක් නොවේ. කිසිවෙකුට සෑම කල්හිම පරමාදර්ශීන් පිළිපැදිය නොහැකි හෙයින් එකී පරස්පරතාවය දැනටමත් මෙහි තිබේ. ශ්‍රී ලංකාවේ ස්ථාවරය වන්නේ පරමාදර්ශයම ප්‍රතික්ෂේප කර දැමීමයි. ශ්‍රී ලංකාව කුමාරයෙකු හෝ කුමාරියක යැයි මානව හිමිකම් කවුන්සිලය සිතයි. නමුත් ශ්‍රී ලංකාව දේශපාලනමය වශයෙන් ගෙම්බෙකු බවට පත්ව සිටියි.



# පව් පින් සේ රසවිදීම

මෙම ලිපිය ලියැවුණේ ශ්‍රී ලංකාව මානව හිමිකම් කවුන්සිලයට මුහුණ දී සිටියදී ය.

ශ්‍රී ලංකාවේ එයට මුහුණ දුන්නේ පුලුවන් නම් අල්ලා ගනිල්ලා යන මානසිකත්වයෙන් යැයි ලේඛකයා යෝජනා කර සිටියි.

ලංකාව මේ වන විට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට මුහුණ දී සිටියි. මෙය මානව හිමිකම් කවුන්සිලය, ශ්‍රී ලංකාවට එහි ජනතාවගේ මානව හිමිකම් තත්වය ඉහළනංවාලිය හැක්කේ කෙසේදැයි සලකා බලමින් සිටින කාලයයි.

ආණ්ඩුව කවුන්සිලයට මුහුණ දෙමින් සිටින්නේ "පුළුවන් නම් අපව අල්ලගනිල්ලා" යන මානසිකත්වයෙන් විය හැකිය. මෙය අතිශය නාට්‍යමය ස්වරූපයෙන් සිදුවෙමින් තිබේ. 'අප අපේ ජනතාවට සලකන විදිහ අපේ ප්‍රශ්නයකි." ආණ්ඩුව ජාත්‍යන්තරයට කියමින් සිටින්නේ එයයි. එනිසා අපේ දේශභූමියේ සීමාව තුළ ගඳ ගසන දේවල් නුඹලාගේ ප්‍රශ්න කර නොගත යුතුය. පරමාධිපත්‍යය පිළිබඳ දේශපාලනමය සංකල්පය අද වන විට අර්ථදක්වා තිබෙන්නේ ඒ ආකාරයෙනි.

ජනතාවගේ යහපත හෝ සතුට වෙනුවෙන් එක්සත් ජාතීන් කරන්නට යන යම්කිසි දෙයකට යම්කිසි ශ්‍රී ලාංකිකයෙක් සහයෝගය දක්වයි නම් එම පුද්ගලයා ද්‍රෝහියෙකු ලෙස හංවඩු ගැසේ. හොඳ පුරවැසියෙකු වීමට නම් ආණ්ඩුව කරන කිසිදු නරකක් හෝ වැරැද්දක් නොදැකිය යුතුය. නොඇසිය යුතුය. මෙය ආත්ම වංචාවක් විය හැකි නමුත් අද කාලයේ ශ්‍රී ලංකාවේ හොඳ පුරවැසියෙකු වීමට නම් ආත්ම වංචනිකයෙකු විය යුතුම ය. ශ්‍රී ලංකාවේ ශුද්ධ වූ භූමිය තුළ ආත්ම වංචාව පවක් නොවේ. එය

මහා පිනකි. ඒ පින භුක්ති නොවිඳින කෙනෙකුට දේශප්‍රේමියෙකු විය නොහැකිය.

මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ පමණක් නොව රට තුළ සිදුවන්නේ ද මෙයයි. උදාහරණ කිහිපයක් ගනිමු. උදාසීන පිරිසක් විසින් විශ්වාසනීය පරීක්ෂණයකින් තොරව අගවිනිසුරුවරිය ඉවත්කිරීම ලෝකයේ වෙනත් රටක සිදුවූවා නම් බරපතළ පවක් වන නමුත් ශ්‍රී ලංකාවේ දී එය එසේ නොවේ. බරපතළ ලෙස විවේචනයට ලක්වූ චෝදනාවලින් නිදහස්වීමට පෙර, විශ්වාසනීයත්වය පිළිබඳ ගැටලු ඇති පුද්ගලයෙකු අගවිනිසුරු ලෙස පත්කිරීම ලෝකයේ වෙනත් තැනකදී බරපතළ පවක් ලෙස සැලකිය හැකි වුවද ශ්‍රී ලංකාවේ දී නම් එය එසේ නොවේ.

ආණ්ඩුවේ සම්බන්ධතා සහිතව සිදුවූ ඉතා බරපතළ අපරාධ පිළිබඳ සාර්ථක පරීක්ෂණ පැවැත්වීමට තමන් ට නොහැකි බව කියාපෑම බරපතළ පවකි. නමුත් ලංකාවේ දී එය පවක් නොවේ.

අත්අඩංගුවට ගැනීමෙන් පසුව හෝ අත්අඩංගුවට ගැනීමට යාමේදී මිනිසුන් මරාදමා ඇති බව කලින් කලට අසන්නට ලැබේ. මොරටුව විහාරාධිපති ස්වාමීන්වහන්සේ ගේ ඝාතනයට සැක කළ පුද්ගලයන් දෙදෙනාගේ සිද්ධිය ද එබඳු ය. ඔවුන් දෙදෙනාම හිස පිටුපසට වෙඩි තබා මරා දමා තිබියදී සොයාගැනිණි. මෙය ලෝකයේ වෙනත් රටක හෝ වෙනත් තැනක සිදුවූවා නම් බරපතළ පවක් ලෙස සලකන්නට ඉඩතිබූ නමුත් ලංකාවේදී එය සැලකෙන්නේ වීර ක්‍රියාවක් ලෙස ය. වෙනත් අපරාධකරුවන් ට ද පාඩමක් උගන්වන හොඳ වැඩක් ලෙස ය.



බරපතළ ලෙස විවේචනයට ලක්වූ චෝදනාවලින් නිදහස්වීමට පෙර, විශ්වාසනීයත්වය පිළිබඳ ගැටලු ඇති පුද්ගලයෙකු අගවිනිසුරු ලෙස පත්කිරීම ලෝකයේ වෙනත් තැනකදී බරපතළ පවක් ලෙස සැලකිය හැකි වුවද ශ්‍රී ලංකාවේ දී නම් එය එසේ නොවේ.

මේ හා සමානව එයට සති කිහිපයකට පසු මෝටර් රථ කොල්ලයකට සම්බන්ධ බව කියූ පුද්ගලයන් දෙදෙනෙකු ද මියගොස් සිටි අතර එම ඝාතනයන් වෙඩිතැබීමකදී සිදුවූ බව කියැවිණි. පොලීසිය විසින් සිදුකරන මෙබඳු අපරාධ ලංකාවේදී අපරාධ ලෙස සැලකෙන්නේ නැත. ඒවා පිළිබඳ පරීක්ෂණ ද නැත.

තවත් සිද්ධියක් විමසා බලමු. ඒ පට්ටානි රාසික් ගේ සිද්ධියයි. මුලින් කියැවුණේ පට්ටනි රාසික් අතුරුදන් වී ඇති බවය. එයින් මාස ගණනට පසු ඔහුගේ මළ සිරුර නිවසක අත්තිවාරම් යට තිබී සොයාගැනුණේය. එම නිවසේ හිමිකරු කවුද යන්න සහ සෙසු සියලු විස්තරයන් හෙළි විය. කෙසේ නමුත් ඝාතනයෙන් වසර 3 ක ට පසුවත් සිද්ධිය ග ැන අධිකරණවල තිබෙන්නේ 'බී' වාර්තාවක් පමණකි. ලෝකයේ වෙනත් රටක මෙය සිදුවූවා නම් මෙය අපරාධයක් බරපතළ ලෙස වසංකිරීමක් ලෙස හෙළා දකිනු ඇත. කෙසේ නමුත් ශ්‍රී ලංකාවේදී දකින්නේ වගකීමෙන් බැහැර වීම සඳහා ගත් අතිශයින්ම බුද්ධිමත් ක්‍රමයක් ලෙස ය.

අවසාන වශයෙන් ප්‍රගීත් එක්නැලිගොඩ සිද්ධිය ගනිමු. ඔහු අතුරුදන් වී ඇති බව කියා තිබේ. නමුත් ඔහු වෙනත් රටක දේශපාලන රැකවරණය පැතූ බවත් ඔහු ජීවතුන් අතර සිටින බවත් කියාපෑම ප්‍රඥාගෝචර යැයි

ආණ්ඩුවේ ප්‍රොපගැන්ඩා යාන්ත්‍රණය සිතයි. ඔහු පිළිබඳ ව නිසි පරීක්ෂණයක් සිදුකරන්නැයි ඔහුගේ බිරිඳ විසින් නිරන්තරයෙන් කරනු ලබන ඉල්ලීමට ආණ්ඩුවේ සැලකීම වූයේ නින්දා අපහාසයි.



> ප්‍රගීත් එක්නැලිගොඩ සිද්ධිය ගනිමු. ඔහු අතුරුදන් වී ඇති බව කියා තිබේ. නමුත් ඔහු වෙනත් රටක දේශපාලන රැකවරණය පැතූ බවත් ඔහු ජීවතුන් අතර සිටින බවත් කියාපෑම ප්‍රඥාගෝචර යැයි ආණ්ඩුවේ ප්‍රොපගැන්ඩා යාන්ත්‍රණය සිතයි. ඔහු පිළිබඳ ව නිසි පරීක්ෂණයක් සිදුකරන්නැයි ඔහුගේ බිරිඳ විසින් නිරන්තරයෙන් කරනු ලබන ඉල්ලීමට ආණ්ඩුවේ සැලකීම වූයේ නින්දා අපහාසයි.

ආරක්ෂක හමුදාව විසින් ලිංගික ලෙස අපහරණයකට ලක්කළ බව කියන කාන්තාවන් 75 දෙනෙකුගේ කතාන්දරයන් හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් ප්‍රකාශනයට පත් කර තිබේ. වෙනත් රටක ආණ්ඩුවක් නම් මෙවැනි වාර්තාවක් බරපතළ ලෙස සැලකිල්ලට ගන්නා අතර මේ චෝදනා පිළිබඳ බරපතළ විමර්ශනයක් ආරම්භ කරනු ඇත. නමුත් ශ්‍රී ලංකාවේ රජයේ ප්‍රකාශක කීවේ මේවා හුදු ගොතන ලද කතා පමණක් වන බවයි. මේ ගැටලුව ගැන ආණ්ඩුවේ උනන්දුව එබඳු ය.

සාමාන්‍යයෙන් එබඳු ලැයිස්තුවක් ලසු වශයෙන් ඉදිරිපත් කෙරෙන්නේ සවිස්තරාත්මක කතාන්දරයන් පිටු සිය ගණනක් විය හැකි නිසා ය.

කෙටියෙන් කියන්නේ නම් ඕනෑම ශිෂ්ට සම්පන්න ජාතියක් පව් ලෙස සලකන දේ ශ්‍රී ලංකාවේදී සැලකෙන්නේ පින් ලෙස ය. යුක්තිය සොයන ඕනෑම කෙනෙකුට "පුළුවන් නම් අපව අල්ලාගනිල්ලා" යැයි පැවසෙයි. හැංගිමුත්තන් සෙල්ලම ආණ්ඩුව කෙළ පැමිණි ක්‍රීඩාවකි. සෙල්ලම දිනන විට ජනතාව අත්පොළසන් නගතැයි අපේක්ෂා කෙරේ.

**- ආසියානු මානව හිමිකම් කොමිසම විසිනි.**



# ළමුන් මරා දැමීම

## සහ

# ශ්‍රී ලංකාවේ ලේ වැකුණු උරුමය

*පසුගිය වසරේ මාතලෙන් හමුවූ සමූහ මිනී වළ සහ 2009 වසරේ ආණ්ඩුවේ හමුදා හා එල්ටීටීඊ ය අතර පැවති සටන්වල අවසන් දිනයන්හිදී අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ ස්වාධීන සහ විශ්වාසනීය පරීක්ෂණයක් පවත්වන ලෙස සිදුකෙරෙමින් පවතින ඉල්ලීම්, ඒවායේ හරයෙන්ම, විනිර්මුක්තියේ පොදු සංරචකයක් සහ යුක්තිය වෙනුවෙන් සිදුකෙරෙන පොදු කෑ ගැසීමකි.*

- **කිශාලි පින්ටෝ-ජයවර්ධන විසිනි.**

## අනාගත පරම්පරාවේ දුක්බර උරුමයන්

මේ අනුව තමන්ව අල්ලාගෙන සිටින්නන් වෙත සැකමුසු ව බලන මියගිය එල්ටීටීඊ නායකයාගේ දොළොස් හැවිරිදි පුත්‍රයා ට පෙනෙන ආකාරයට හමුදා බංකරයකදී කෑමට යමක් දී ඇති අයුරු සහ අවසානයේ ඔහුට වෙඩි තබා ඇති ආකාරය දැක්වෙන ඡායාරූප (එම ඡායාරූප වෙනස් කළ ඒවා වූවත් නොවූවත්) සංසරණය වන විට එකී පින්තූර ශ්‍රී ලංකාව මානුෂිකත්වය අතින් හායනයට ලක්වී ඇති බව සම්බන්ධයෙන් අපව සහතික ලෙසම දෘඩ ග්‍රහණයකට ලක් කළ යුතුද?

මෙම ඡායාරූප, 1987 වර්ෂයේ අරන්තලාවේදී සාහසික ලෙස මරා දැමුණු ළමා භික්ෂූන් වහන්සේලගේ ඡායාරූප සහ දකුණේ සිංහල නැගී සිටීමේදීත් උතුරේ යුද්ධයේදීත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයන් විසින් ඝාතනය කළ දහස් ගණනක් වූ දරුවන්ගේ ඡායාරූප ද සමග එක පෙළට ශ්‍රේණිගත කළ යුතුය.

මේවා අපේ අනාගත පරම්පරාවේ දුක්බර උරුමයන් ය.

## හදිසි නීතිය ඇති විට ඝාතනවලට අවසර ඇත.




නියත වශයෙන්ම ශ්‍රී ලංකාවේ නෛතික රාමුව විසින් අධිකරණයෙන් පිටත සිදුකරන මරාදැමීම් සහ බලහත්කාරයෙන් සිදුකරන අතුරුදන්වීම්වලට අවසර ලබාදී ඇති අතර එබඳු අපරාධ සැකයක් නැතිවම, දිරිමත් කිරීම ද සිදුකරයි. ත්‍රස්තවාදී ක්‍රියාවන් පිළිබඳ රජයේ පාපසහායකත්වය අනුව බලන විට, දෙවැනි ජවිපෙ නැගී සිටීම සිදුවූ සමයේ සිදුවූ අපරාධවල යෙදුණු අපරාධකරුවන් ට විරුද්ධ ව ක්‍රියාමාර්ග ගන්නා ලෙස සහ විධිමත් පරීක්ෂණ පවත්වන ලෙසත් නඩු විභාග පවත්වන ලෙසත් ජාතික සහ අන්තර්ජාතික වශයෙන් අධිකතර පීඩනයක් එල්ලවීම පුදුමයට කරුණක් නොවීය. මෙවැනි පරීක්ෂණ, විමර්ශන සහ නඩු විභාග පැවැත්වුණේ ඉතා දුර්ලභ ලෙස වූ අතර, එසේ පැවැත්විණි නම් ඒ ද කණිෂ්ඨ නිලධාරීන් ට එරෙහි ව පමණක් විය.

තර්කාංගය වූයේ, බරපතළ අපරාධ සිදුවුවද, ඒවා සාමාන්‍ය සොල්දාදුවන්ට/හමුදා නිලධාරීන්ට අසාමාන්‍ය ආතතියක් එල්ල වූ අවස්ථා වූ අතර මේ අනුව වගකිවයුතු බවේ ඉහළ ප්‍රමිතියකට එරෙහිව එය නොමිනිය යුතු බවයි. මෙයට අනුරූප ව මෙබඳු සිද්ධීන් තාර්කික නිගමනයක් වෙත ගෙන යාමේ දේශපාලන කැමැත්තේ අඩුකම පැහැදිලි ව දැකගත හැකි වූ නමුත් ඒවා අදාල වූයේ උතුරේ හෝ දකුණේ සහ නැගෙනහිර බලහත්කාරයෙන් සිදුවූ අතුරුදන්වීම් සම්බන්ධයෙනි.

දේශපාලන බලය උපරිම ලෙස විදහාදැක්වුණු අවස්ථාවන්හිදී වුවද හමුදා ආයතනවල මුරණ්ඩුභාවය විසින් ඒවාට එරෙහිව ශක්තිමත් පදනමක් සහිත ක්‍රියාමාර්ග ගැනීම වැළැක්විණි. මේ සඳහා හොඳ උදාහරණක් වන්නේ, 1996 ජනවාරි මස එවකට ජනාධිපතිනි කුමාරතුංග විසින්, අතුරුදන්වූවන් පිළිබඳ කොමිෂන් සභා වාර්තා සැලකිල්ලට ගැනීමෙන් පසුව හමුදා සේවයේ නිරතවූවන් 200 දෙනෙක්, බරපතළ මානව හිමිකම් උල්ලංඝනය සඳහා ඔවුන් නැවත නැවතත් සම්බන්ධ වීම සැලකිල්ලට ගෙන, ඔවුන්ව නිත්‍ය නිවාඩු යවන ලෙස යුධ හමුදා අණදෙන නිලධාරියා මෙහෙයවීමයි. කෙසේ නමුත් මෙම නියෝගය ක්‍රියාවට නැංවුණේ නැත.

සාමාන්‍යයෙන් බලත්කාරයෙන් සිදුකරනු ලබන අතුරුදන්වීම් හා අධිකරණයෙන් පිටත සිදුකරන ඝාතන සම්බන්ධයෙන් විමර්ශන, නඩු විභාග දක්වා ගෙන යාම කෙරෙහි රාජ්‍යය උදාසීන බවක් දක්වයි. රාජපක්ෂ ආණ්ඩුව යටතේ මෙම උදාසීන බව, හිතාමතා සිදුකරන රාජ්‍ය ප්‍රතිපත්තියක් බවට පත්ව තිබේ.

## නීති ක්‍රමයේ සකල අසාර්ථක වීමක්

සාමාන්‍යයෙන් බලත්කාරයෙන් සිදුකරනු ලබන අතුරුදන්වීම් හා අධිකරණයෙන් පිටත සිදුකරන ඝාතන සම්බන්ධයෙන් විමර්ශන, නඩු විභාග දක්වා ගෙන යාම කෙරෙහි රාජ්‍යය උදාසීන බවක් දක්වයි. රාජපක්ෂ ආණ්ඩුව යටතේ මෙම උදාසීන බව, හිතාමතා සිදුකරන රාජ්‍ය ප්‍රතිපත්තියක් බවට පත්ව තිබේ. ලඝු නොවන පරීක්ෂණයක් අවශ්‍ය වන අවස්ථාවන්හිදී පොලීසිය අභිචෝදනය කරන්නේ විශේෂ වැදගත්කමකින් යුතු දුර්ලභ නඩු විභාග සඳහා පෙනී සිටින රජයේ නීතීඥයන් සමගිනි.

ලඝු නොවන පරීක්ෂණ සිදුවන්නේ කිසිදු උනන්දුවක් නැති ආකාරයෙන් වන අතර මාස ගණනක් ඒ සඳහා වැය කරයි. සාක්ෂි එක් රැස්කිරීම සහ හොඳ විමර්ශන පැවැත්වීම සම්පූර්ණයෙන්ම පොලිසිය ට පැවරෙන අතර මහේස්ත්‍රාත්වරයා හෝ නීතිපතිවරයා විසින් ඒවා බරපතළ ආකාරයෙන් අධීක්ෂණය කිරීමක් සිදුනොවේ.
චෝදනා පත්‍ර ගොනු කිරීමේදී කෙළවරක් නැතිව ප්‍රමාද වීම, ලඝු නොවන පරීක්ෂණවල ප්‍රමාදය සහ ඒවායින් පසු සිදුවන නඩු විභාගකිරීම්වල ප්‍රමාදයන් පොදු සාධකයන් ය. චෝදනා පත්‍ර ගොනු කිරීමේ පළමු පියවර සම්පූර්ණ වීමට වසර කිහිපයක් ගත වන අතර ඉන්පසු නඩු විභාගයේදී ද තවදුරටත් ප්‍රමාදයන් සිදුවන ආකාරය දැකගත හැකිය. දකුණේ සාමාන්‍ය පුද්ගලයන්ගේ වධ හිංසා නඩුවලදී ද මේ රටාව ම පොදු වශයෙන් දැකගත හැකි වේ. වධ හිංසාවට එරෙහි සම්මුතිය යටතේ පවරන නඩු සහ සෙසු අමානුෂික හා අවමන් සහගත දඬුවම් පිළිබඳ 1994 අංක 22 දරණ පනත (මෙතැන් සිට මෙය වධ හිංසා විරෝධී පනත යනුවෙන් හැඳින්වේ) යටතේ අදාළ මහාධිකරණවල ගොනු කරන චෝදනා පත්‍ර වසර දෙකකට අධික කාලයක් ප්‍රමාද වෙමින් පවතියි. විත්තිය පවසන්නේ මෙම ප්‍රමාදය සිදුවන්නේ අධිකරණයේ ගොඩ ගැසී ඇති නඩු හේතුවෙන් බව ය. වින්දිතයන් වෙනුවෙන් පෙනී සිටින නීතීඥයෝ, නඩු විභාග පැවැත්වීම සඳහා රාජ්‍යයේ පාර්ශවයෙන් පවතින අඩු උනන්දුව පිළිබඳ පැමිණිලි කරන අතර නඩුව පැවැත්වෙන දිනයන්වලදී විත්තියේ නීතීඥයන් අධිකරණයේ පෙනී නොසිටීම හා නඩු විභාගය කල් තබන ලෙස දිගින් දිගටම අයදුම්කිරීම මෙම රාජ්‍ය පාර්ශවයේ උනන්දුව අඩුකම විදහාදැක්වීමක් බව පවසති.

## එක්දහස් නවසිය ගණන්වල සිට තවදුරටත් සමූහ මිනී වළවල්

මාතලේ රෝහලට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ යෙදී සිටි කම්කරුවන් විසින් සොයාගත් මාතලේ සමූහ මිනීවළ පුද්ගලයන් 150 කට අධික පිරිසකගේ ඇටසැකිළිවලින් සමන්විත විය. මෘත කලේබරවල පවතින තුවාළ හේතුවෙන් මේවා යම්කිසි අපරාධයක කොටස් බව වෝහාරික පරීක්ෂණවලදී පැවසිණි. සාමාන්‍ය දැනීම මගින්,

මෙය 1987-1991 සමයේ UNP ආණ්ඩුව පැවති කාලයේ ඇතිවූ දෙවැනි ජවිපෙ නැගී සිටීම සිදුවන විට නීතියෙන් පිටත සිදුකළ ඝාතනයන් හා අතුරුදන්වීම්වලින් පසුව පුද්ගලයන් වළදැමූ ස්ථානයක් බවට වන නියත නිගමනයට බොහෝ අය එළඹුණහ.

කැරැල්ලෙන් දශක දෙකකට පසුව පවා, එම සමයට අදාළ සමූහ මිනී වළවල් තවමත් මතුවීම සිත කළඹනසුලු ය. එම මෘත කලේබරයන් පිළිබඳ නිසි විමර්ශන පවත්වන ලෙසටත් ඒවා නිසි ලෙස වාර්තාගත කරන ලෙසටත් ඉල්ලීම් සිදුකර ඇති නමුත් එම ඉල්ලීම්වලට සැබවින් ම ඇහුම්කන්දීමක් සිදුනොවනු ඇත. 2009 වර්ෂය තුළ දමිල වැසියන් අතුරුදන්වීම සම්බන්ධයෙන් ද, මෙකී ප්‍රතික්ෂේපකිරීම ම වර්තමාන ආණ්ඩුව විසින් ශුන්‍යයක් ලෙස සලකනු ඇත.

**ශ්‍රී ලංකාව තුළ අහිංසකයන්ගේ රුධිරය වැගිරීම පිළිබඳ වගකීම එක් තනි පක්ෂයකට, රාජ්‍ය ක්‍රියාකාරිකයෙකුට හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයෙකුට, ජනාධිපතිවරයෙකු ට හෝ විරුද්ධ පක්ෂ නායකයෙකුට තනිව පැවරිය නොහැක.**

## යුක්තිය උදෙසා පොදු කෑ ගෑමක්

මාතලේ සමූහ මිනී වළේ වින්දිතයන් බවට පත්ව සිටින්නේ සිංහලයන් බව හෝ 2009 වර්ෂයේ අතුරුදන්වූයේ ද්‍රවිඩයන් බව ගැටලුව නොවේ. ඔවුන් දෙපිරිසම එකම පොදු ඉරණමක් බෙදාහදාගත්තවුන් ය. ඔවුන්ගේ වැළපීම්, කෑ මොර දීම්, සියලු ආණ්ඩුවල පාලනය යටතේ ගතවූ දශකයන් තුළ එකම ඉරණමක් අත් කරගත් දහස් ගණන් වූ සෙස්සන්ගේ වැළපීම් හා කෑමොර දීම් සමග සම්මිශ්‍රණය වේ. ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ මෙතෙරදීත් එතෙරදීත් කරන විවාදයේදී මේ පොදුභාවය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. ශ්‍රී ලංකවේ එක් එක් ආණ්ඩු විසින් සිදුකළ ම්ලේච්ඡ ක්‍රියා, පසුගිය ආණ්ඩු සිදුකළ ම්ලේච්ඡ ක්‍රියාවන්ගේ දීර්ඝ වීමක් සහ මනුෂ්‍යත්වයේ ඌනභාවයක් වන්නේ යන්තමින් පමණි.

තවද සහතික වශයෙන්ම, මෙකී සාහසික ක්‍රියාවන් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්, විශේෂයෙන්ම ජවිපෙ සහ එල්ටීටීඊ ය විසින් ඔවුන්ට එරෙහි වූවන් ට සහ ඔවුන් විසින් ද්‍රෝහීන් ලෙස සැලකූ අයට එරෙහිව සිදුකළ සාහසික ක්‍රියාවන්ගේ ද පිළිබිඹුවක් ද වේ. ශ්‍රී ලංකාව තුළ අහිංසකයන්ගේ රුධිරය වැගිරීම පිළිබඳ වගකීම එක් තනි පක්ෂයකට, රාජ්‍ය ක්‍රියාකාරිකයෙකුට හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයෙකුට, ජනාධිපතිවරයෙකු ට හෝ විරුද්ධ පක්ෂ නායකයෙකුට තනිව පැවරිය නොහැක.

මේ ලේ වැකුණු දේශපාලන බූදලයෙන් අපට අපව නිදහස් කර ගත හැක්කේ ශ්‍රී ලංකාවේ දරුවන් මරා දැමීම නතර කරන දිනයක පමණකි.

FOCUS ON RIGHTS By Kishali Pinto Jayawardene - *ද සන්ඩේ ටයිම්ස්*



# ජා ති ක ආ ර ක් ෂා ව

ඒ නම ඇසුණු විට

පාෂාණවලට පවා

මුද්‍රා පහවෙයි.

පියාඹන හැටි

පක්ෂීන්ට අමතක වෙයි.

සියලු සිනහව අමතක වේ මල් වලට

මව්වරු සිය දරුවෝ සඟවති,

රාජාලියාගේ යක්ෂ ඇස යොමුවන බව දැනී

කිකිළියන් සිය පැටවුන් සඟවන්නා සේ.

මිත්තණියෝ වැළපෙති

ඡායාරූප දෙස බලමින්.

- බැසිල් ප්‍රනාන්දු

# මළ මිනිස්සු බොරු නොකියති




මධ්‍යම ශ්‍රී ලංකාවේ මාතලේ නගරයෙන් පුද්ගලයන් 150 කට අධික සංඛ්‍යාවකගේ මෘත ශරීර කොටස් හමුවිය. මෙම ඇටසැකිළි කොටස් හමුවූයේ පසුගිය වසරේ මාතලේ රෝහල සඳහා ගොඩනැගිල්ලක් ඉදිකරමින් සිටියදීය. විමර්ශන භාර ව සිටින මාතලේ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී වෛද්‍ය අජිත් ජයසේන, මෙම ක්ෂේත්‍රය අපරාධයක් සිදුවූ ස්ථානයක් යැයි අල් ජසීරා පුවත්සේවය අමතා පැවසීය. අදාළ පුද්ගලයන් මියගියේ කවදාද යන්න දැනගැනීම සඳහා අස්ථි කොටස් ද පස් සාම්පලද විදෙස් පරීක්ෂාව සඳහා යවා තිබේ.

වසර සියයකට පමණ පෙර මෙම ප්‍රදේශයේ පැතිර ගිය වසූරිය රෝගයෙන් මියගිය පුද්ගලයන් මෙහි භූමදාන කර ඇතැයි මතයක් තිබේ. නමුත් ඇටසැකිළිවල ස්වභාවය සහ ඒවා තිබූ රටාව අනුව පෙනී යන්නේ මෙය සාමාන්‍ය භූමදාන ක්ෂේත්‍රයක් නොවන බවයි.

> *“හිස ගසා දැමූ සහ ශරීරයෙන් වෙන් කළ කොටස් මෙහි තිබෙනවා. අපරාධයක් සිදුවී ඇති බව නිසැකයි.”*
>
> - **අධිකරණ වෛද්‍ය නිලධාරී**

මාතලේ, 80 දශකයේ ජවිපෙ නැගී සිටීම දරුණු ලෙස සිදුවූ ප්‍රදේශයකි. එහිදී දරුණු රාජ්‍ය මර්දනයට ලක් කළ තරුණයන් ම්ලේච්ඡ ලෙස ඝාතනය කිරීමෙන් පසුව මෙහි සමූහ මිනී වළක් ලෙස වළදමන්නට ඇති බව ට පවතින මතය බැහැර කළ නොහැකිය.

*“විමර්ශනවල පළමු කොටස දෙස බලන්න. එහිදී සිදුකෙරුණේ මෙම අවශේෂයන් ඝාතනයට ලක්වූ අයගේද යන්න තීරණය කිරීමයි. අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් එය එසේ බව කිය තිබෙනවා. නමුත් දුෂ්කරම කොටස තිබෙන්නේ දැනුයි. මෙහිදී ආකාර දෙකක දුෂ්කරතා පැන නගිනවා. පළමු දුෂ්කරතාවය ව්‍යවහාරික විමර්ශන කටයුතුයි. සියල්ලටම පෙර මේ මරණ සිදුවූ කාලසීමාව හඳුනාගැනීම සහ ඉන්පසුව ඒ ඇටසැකිලි කාගේදැයි හඳුනාගැනීම.*

*දැවැන්තම දුෂ්කරතාවය වන්නේ අපරාධ යුක්තික ක්ෂේත්‍රයයි. මෙහිදී පොලිස් විමර්ශන අවශ්‍ය වේවි. මේ සම්බන්ධයෙන් තොරතුරු මේ වන විටත් ලැබී තිබෙනවාද, නැතිනම් මේ ප්‍රදේශවල මිනිසුන් මේ පිළිබඳ පැමිණිලි කර තිබෙනවාද කියා තොරතුරු රැස්කිරීමට ඔවුන්ට සිදුවෙනවා. මෙම ප්‍රදේශයේ ඝාතන විශාල සංඛ්‍යාවක් සිදුවූ බවටත්, ඒවා සිදුවූ හමුදා කඳවුරු ප්‍රදේශයේ තිබූ බවටත් තොරතුරු තිබෙනවා. නමුත් ප්‍රශ්නය වන්නේ, ශ්‍රී ලංකාවේ, මෙතැනින් එහාට විමර්ශන සිදුවන්නේ නැහැ. සන්නද්ධ හමුදාව හෝ පොලීසිය ඉලක්ක වී ඇති විට, ඔවුන් විසින් සිදුකරන ලද අපරාධ මතුපිටට ආ විට විමර්ශනවලට එතැනින් එහාට යන්නට ඉඩ දෙන්නේ නැහැ. කැණීම් හා කාය සොයාගැනීම් සහ මළ සිරුරු හඳුනාගැනීම ආදිය සම්බන්ධයෙන් මෙන්ම අපරාධ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ද එක්සත් ජාතීන්ගේ විශේෂඥ සහාය නොලැබෙන්නේ නම්, කිසිවක් සිදුවන එකක් නැහැ. ලංකාව පණස් දහසත් හැත්තෑපන් දහසත් අතර පිරිසක් අතුරුදහන් වී තිබෙන රටක්.”*




- ආසියානු මානව හිමිකම් කොමිසමේ විධායක අධ්‍යක්ෂ බැසිල් ප්‍රනාන්දු අල් ජසීරා පුවත්සේවය අමතමින්

# ඇය ඔබව සොයන්නීය

- බැසිල් ප්‍රනාන්දු - Pride and Pain in Difficult Times

(සොම්චායි නීලපායිජිත් වෙනුවෙන් ලියූ කවි පෙළකි.)



අපි යන්නෙමු
ඔබව සොයමින්.
නිවැරදි වීම පිණිස,
ඇය යන්නීය
ඔබව සොයමින්.
නිවැරදි වීම පිණිස,
ඇය යන්නීය
ඔබේ ඇටකටු සොයමින්,
එසේත් නැතිනම්
ඔබේ වෙන යම් දෙයක් සොයමින්
කෙස් ගසක් හෝ ඇඳුම් කෑල්ලක්.

අප උප කමිටුව පමණයි
ඇයට උදව් කරන
ඔබ සොයන්නට.
අපි යන්නෙමු
අත්හැර දැමූ තැනෙක ඇති
අත්හැර දැමූ නිවසකට.
එයට ඉදිරියෙන්
ව්‍යෝහාරිකයෝය
උප කමිටුවට උදව් කරනට.
හැම කෙනෙක්ම සොයන්නේ
ඔබෙන් යම් කෑල්ලක්.

වෝහාරිකයෝ සොයාගනිති,
කුණු පුළුස්සන තැන තිබී
ඇටකටු ගොඩවල් දෙකක්.
ඔබ සොයාගත්තා කියා
අප හිතනවා යැයි
වෝහාරිකයෝ කියත්.
ඒ මිනිස් ඇටකටුය.
අපි ඔබව සොයාගත්තා
කියා අපි සිතන්නෙමු.

නමුත් මග තව දුරයි
කෙත් වතු මැදින්
තවත් ඇටකටු මැදින්,
විද්‍යාගාර හරහා,
නීති විශාරදයන් හරහා,
විනිසුරන් හරහා,
ඒ ඔබ යැයි අවසානයේ
විශ්වාස කළ යුත්තේ කවුද...
ඈ ඒ ගමන යන්නීය.
අපිදු ඈ සමග යන්නට සිතන්නෙමු.
ඈ ඔබව සොයාගන්නා තෙක්.




බලය දූෂණය
ඇති කරයි.

පරම බලය
පරම දූෂණය
ඇති කරයි.

-ජෝන් ඩැල්බර්ග් ඇක්ටන්
(ඇක්ටන් සාමි)

# මෙහෙව් රටක්




ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවැත්වෙන මානව හිමිකම් සමුළුවේදී ලංකාවට විරුද්ධව වචනයක්වත් කියා නැවත මව්බිමට පය තබන අය එසැණින් අත්අඩංගුවට ගත යුතු බව බොදුබල සේනාව කියයි. පෙනෙන හැටියට නීතිය අතට ගත් චීවරධාරීන් පමණක් නොව විමල් වීරවංශලා ඇතුළු මහරජාණන් උදේ හවා නමදින ගෝලබාලයන්ටද මේ දිනවල තිබෙන ලොකුම ගැටලුව ජිනීවා සමුළුවයි. ඔවුන්ට එය ගෙඩි පිටින්ම විජාතික කුමන්ත්‍රණයකි. නවනීදන්පිල්ලේ ලංකාවට පහර ගසන දෙමළ ඩයස්පෝරාවේ හෝ කොටි බළල් අත්වල පදයට නටන්නියකියි ඔවුහු රස කර කියති. 22 වැනි ජිනීවා මානව හිමිකම් සමුළුව ආරම්භ කරමින් මානව හිමිකම් කොමසාරිස් නවනීදන් පිල්ලේ නොකිවයුතු දෙයක් කීවාද? ඇය කීවේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගැන ප්‍රශ්න තිබෙන බව ය. යුද්ධයේ අවසන් දිනවලදී සිද්ධ වූ දේ සෙවීමට ආණ්ඩුව විසින්ම පත් කළ උගත් පාඩම් කොමිසමේ නිර්දේශවත් හරිහැටි ක්‍රියාවට නංවන්නට ආණ්ඩුව තවම අපොහොසත් වී ඇති බව ය. ලෝකයම ලංකාව බවත් ලංකාවම මැදමුලන බවත් සිතාගෙන සිටින අය ජාත්‍යන්තරයට අපේ ප්‍රශ්න ගැන හොයන්නට ඇති අයිතිය කුමක්දැයි අසති. එසේ අසා ප්‍රශ්නය මග හරිති.

ලෝකෙන් උතුම් රට ලංකාව යැයි කියාගත් අපට අද වන විට තිබෙන්නේ තුන් සිංහලයම බතින් බුලතින් සාර රටක් නොවේ. අප ස්වයංපෝෂිතයි නම් සිව් මහා නදී ගලා යන රටේ මධ්‍යම කඳුකරයේ දියඇලි බර ගණනක් තිබියදීත් විදුලි බිල තවත් සියයට හැත්තෑ පහකින් වැඩිකරන්නට යෝජනා වන්නේ නැත. සිය රට දේ සිරි සැප දේ කියා කීවාට ජාත්‍යන්තර සම්බන්ධතාවලින් තොරව ජීවත් වන්නට ලංකාවට පුළුවන් නම් මහින්ද රාජපක්ෂ මත්තල ගුවන්තොටුපොළක් සාදන්නේ නැත.

සිංහලයා මෝඩයා බවත් වැඩිම වුණොත් සිංහලයාට දෙයක් මතකයේ රැඳෙන්නේ සතියක් පමණක් බවටත් ජනප්‍රිය කියමනක් තිබේ. ඒ කියමනට සරිලන්නට දැන් වැඩි දෙනෙකුට ගරු අගවිනිසුරුතුමිය ශිරානි බණ්ඩාරනායක මතක නැත. ඇය තවමත් රටේ අගවිනිසුරුවරිය බව මාධ්‍යවලට ද අමතක වී තිබේ. මේක පුදුම රටකි. අතිගරු උතුමාට කළ නොහැකි දෙයක් නැත. ඔහු අගවිනිසුරුවරිය පන්නා දමා සිය පුද්ගලික නීති උපදේශකවරයා රටේ අගවිනිසුරු කළේය. ඒ අගවිනිසුරු, තමන් අගවිනිසුරු පදවියට පත්වීම සුදුසුදැයි තමන්ම විභාග කර ගත්තේය. රටේ ස්වභාවික යුක්තිය එබඳු ය.

> ‘මානව හිමිකම්’ යන්න රටේ දැන් තහනම් වචනයකි. මානව හිමිකම් ක්‍රියාකාරීන් දේශද්‍රෝහීන් බව රට කරවන අය කියා තිබෙන්නේ වරක් දෙවරක් නොවේ.

‘මානව හිමිකම්’ යන්න රටේ දැන් තහනම් වචනයකි. මානව හිමිකම් ක්‍රියාකාරීන් දේශද්‍රෝහීන් බව රට කරවන අය කියා තිබෙන්නේ වරක් දෙවරක් නොවේ. ලංකාවේ මානව හිමිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට පමණක් සීමා වෙද්දී උදා වී තිබෙන්නේ එම අයිතිවාසිකම් ද බලාත්මක කර ගැනීම සිහිනයක් වන කාලයකි. මානව හිමිකම් පවතින්නේ පාලකයාගෙන් සිදුවන අකටයුතුකම්වලින් ජනතාවට යුක්තිය ඉටුකරගැනීම සඳහාය. ඒවා සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම ලංකාවේ අන්තර්ජාතික බැඳීමකි. නමුත් පාලකයන් ඒ බව පිළිගන්නට සූදානම් නැත. ජිනීවා හිදී ලංකාවට විරුද්ධ ව යෝජනාවක් සම්මත වුවහොත් සම්බාධක පැනවෙනු ඇත. ජාත්‍යන්තර ආධාර අඩුවනු ඇත. එය එසේ වුවහොත් එහි බලපෑම ද පාලකයන් ට නොවේ. සාමාන්‍ය ජනතාවට ය. දැනටමත් සියයට තුන්සියයකින් වැඩිවී ඇති බඩු මිල නිසා පොදු ජනතාව සිටින්නේ හොඳ සිහියෙන් නොවේ. ජීවන සටන ගැටගසා ගැනීම ගැන දිවා රෑ කල්පනා කරන ඔවුන්ට රටේ ප්‍රශ්නවලට වඩා ලොකු-තමන්ගේ ප්‍රශ්න තිබේ. මේ බේදයේ ද වාසිය රාජපක්ෂලාට ය. ජනතාවට පීඩනය පටවන තරමට ලෝකයේ ලොකුම ඇමති මණ්ඩලයේ නඩත්තුවද ඔවුන්ට පහසු වේ. මන්ද, ජනතාවට ඒවා ප්‍රශ්න කරමින් කල් ගතකරනවාට වඩා විසඳාගන්නට අඟහිඟකම් ගැන ප්‍රශ්න තිබෙන නිසා ය. ජනතාවගේ හෘද සාක්ෂිය කෙමෙන් මිය යමින් තිබේ. අසාධාරණයට අයුක්තියට පාරට බසින ජනතාව කෙමෙන් අඩුවන්නේ තමන්ගේ පාඩුවේ වැඩක් බලාගෙන සිටිනා තරමට සුදුවැන් රථ ප්‍රාදූර්භූතවීමේ අවදානම අවම බව ඔවුන් අත්දැකීමෙන් දන්නා නිසාය. ජනතාවට දැන් ඇස් කන් නැති ගාන ය.

## ප්‍රජාතන්ත්‍රවාදය තුළ කිසිවෙකු ප්‍රශ්න නොකළ යුතු තරමට දෙවිවරු නොවේ.

මේක ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයකි. යටත් පිරිසෙයින් එය එසේ විය යුතු බවට ශිෂ්ටසම්පන්න ලෝකයේ පිළිගැනීමක් තිබේ. සම්මුතික නීතියෙන් එකඟ වී ඇති පරිදි අප කරන කියන දෙය ගැන ප්‍රශ්න කරන්නට ලෝකයේ සෙසු රටවලට සහ එක්සත් ජාතීන්ට අයිතිය තිබේ. රටක් වශයෙන් ශ්‍රී ලංකාව කළ යුත්තේ සිය වගකීම සහ වගවීම පිළිබඳ උත්තර සැපයීමයි. මෙය දඬුවමක් නොවේ. අනිසි බලපෑමක් ද නොවේ. ලෝකයේ බල තුලනය රඳවා ගන්නා සම්මත ක්‍රමවේදයකි. එය සංවරණය සහ තුලනයයි. (චෙක් ඇන්ඩ් බැලන්ස්) එක් අයෙක් කරන කියන දේ තවත් අයෙකුගේ අධීක්ෂණයට ලක්වේ. එවිට අත්තනෝමතික හැසිරීමක් තිබේ නම් එය ප්‍රශ්නකිරීමට ලක්වේ. කිසිවෙකු ප්‍රශ්න නොකළ යුතු තරමට දෙවිවරු නොවේ. ප්‍රශ්නය වන්නේ ලංකාවේ වත්මන් පාලනය උත්තර බඳින්නට අකමැති වීමයි. ඔවුන් උත්තර දෙන්නට අකමැති ඇයි? පිළිතුර සරල ය. ඒ අසන ප්‍රශ්නවලට ලංකාවට උත්තර නැත. කාලකණ්ණි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් විධායක ජනාධිපතිවරයා ප්‍රශ්න නොකළ යුතු දෙවියෙකු බවට පත් කර තිබේ. අතිගරු උතුමා අඩුම ගණනේ තමන්ටවත් උත්තර දෙන්නේ නැත.

## එදා

## සහ



මම කියනවා මේ ආණ්ඩුව මානව අයිතිය නැති කරන්න යනව නම් ජිනීවා වලට නෙවෙයි ලෝකෙ ඕනෙ තැනකට- එහෙමත් නැතිනම් නරකාදියට හෝ ගොස් මේ ආණ්ඩුවට විරුද්ධ ව ක්‍රියාකරන බව. ඒ අයිතීන් ලබාගැනීම සඳහා කියන ඕනෑම තැනකට යන්න අපි සූදානම් ය කියන එක අපි මතක් කරන්න ඕනෙ. එකක් මතක තියාගන්න ඇමතිතුමා. අපිට තියෙන අයිතිය උදුරගන්න දෙන්නෙ නෑ... ඒක මතක තියා ගන්න...

-මහින්ද රාජපක්ෂ - 1990. 10. 25 හැන්සාඩ් වාර්තාව

# අද



# “අප තිදෙනා බලාගන්න”



**- දහසය වසරක් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවය කළ අගවිනිසුරුවරියකගේ ආයාචනය**

ලංකාවේ අගවිනිසුරුවරිය ශිරානි බණ්ඩාරනායක උත්තර්ජනය යටතේ සිය නිල නිවසෙන් පිටත්ව යන විට ඇය ව වටකර දැවැන්ත පොලිස් හා හමුදා බල ඇණියක් යොදා තිබූ අතර කිසිදු ප්‍රකාශයක් නිකුත් කිරීමෙන් ඇයව වළක්වා තිබුණේය. එසේ නමුත් සිය නිර්දෝෂී භාවය වෙනුවෙන්, නීතියට අනුව තමන් කළේ මොනවාද යන්නත් ඇය සැලකිලිමත් වූයේ ජනතාවගේ අභිලාෂය පිළිබඳ බවත් නැවත වරක් කියාපාමින් වචන කිහිපයක් පැවසීමට ඇය සමත්වූවාය.

කෙසේ නමුත් ඇගේ කෙටි ප්‍රකාශයේ වඩාත් ම කම්පාකරවනසුලු කොටස වන්නේ ‘අප තිදෙනා බලාගන්න’ යන්නයි. එයින් ඇය අදහස් කළේ ඇගේ පවුල පිළිබඳ ව ය. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ 16 වසරක් සේවය කළ විනිසුරුවරියකගේ මේ වදන් හෘද සාක්ෂියක් සහිත සෑම පුරවැසියකුගේම සිත් හි දෝංකාර දිය යුතුය. රටේ අගවිනිසුරුවරිය පවා ඝාතන තර්ජනය යටතේ ජීවත් වන බව සහ තමන්ගේ ආරක්ෂාව පිළිබඳ සෝදිසියෙන් සිටින්නැයි රටේ ජනතාවගෙන් ඉල්ලා සිටින්නට සිදුවූ බව සිත් තබා ගත යුතුය.

ඇයට සිත් කරදර කරගැනීමට තරම් වටිනා හේතුවක් තිබේ. එය වන්නේ, මෙයට වඩා සුළු ක්‍රමවලින් ආණ්ඩුව සමග විසම්මුතික වූවන් ට සිය විසම්මුතිය වෙනුවෙන් විශාල මිලක් ගෙවන්නට සිදුව තිබීමයි. මේ අනුව, අගවිනිසුරු ධුරයේ සිටීම මගින්, ගතවූ මාස කිහිපයේදී ජනාධිපති රාජපක්ෂගේ පාලන තන්ත්‍රය එය මුහුණදුන් විශාලතම අභියෝගයට පාත්‍ර කළ ආචාර්ය ශිරානි බණ්ඩාරනායක ඇය සහ ඇගේ පවුලේ අයගේ ජීවිත පිළිබඳ බියට පත්වීම පුදුමයක් නොවීය.

රාජපක්ෂ රෙජීමයට ඇය නිශ්ශබ්ද කිරීමට අවශ්‍ය වන හේතු ගණනාවක් ඇත. ඇයට විරුද්ධ ව නැගූ චෝදනාවල ව්‍යාජබව පිළිබඳ ගැටලුවම, ශ්‍රී ලංකා ආණ්ඩුව රට තුළ මෙන්ම රටෙන් පිටතදීත් මුහුණදෙන විශාලතම ගැටලුවලින් එකක් වශයෙන් තවදුරටත් පවතිනු ඇත. චෝදනා පිටුපස තිබූ දුෂ්ට චේතනා විසින් , තරගකාරී සහ අපක්ෂපාතී විනිශ්චය සභාවක් ස්ථාපිත කිරීමෙන් ආණ්ඩුව දැනටමත් වළක්වා තිබේ. එය ආණ්ඩුවට ඉදිරි දීර්ඝ කාලයක් සඳහා ගැටලු රාශියක් ඇති කරනු නිසැක ය. එපමණක් නොව, චෝදනාවල ව්‍යාජභාවය විසින් ආණ්ඩුව සද්භාවයෙන් ක්‍රියා කළේය සහ ඇය ඉවත් කළේ රටේ යහපත සඳහා ය යනුවෙන් ආණ්ඩුව කියාපාන හේතු කුණුකූඩයට ඇද දමනු ඇත. ඈ ඉවත් කළේ රටේ යහපතට යැයි ආණ්ඩුවේ ප්‍රචාරණවාදී යාන්ත්‍රණය විසින් රාජ්‍ය මාධ්‍ය හරහා දුෂ්ටතම ආකාරයෙන් චරිත ඝාතනය කිරීමේ ව්‍යාපාරයකදී කියා තිබේ.

ආණ්ඩුවේ ප්‍රකාශ සහ මෙහෙයවීම්වලට සිය ශක්නුතාව මගින් දිගින් දිගටම අභියෝග කිරීම, ඇයව ආණ්ඩුවේ ප්‍රහාරවල අසාමාන්‍ය ඉලක්කයක් බවට පත් කළේය.



**'මට කාටවක්වත් ස්තුතියි කියන්න ලැබුනේ නැහැ මට.. මට අවස්ථාවක් හම්බ උනේ නැහැ.. මම නිවේදනයක් නිකුත් කරනවා.. මම අවුරුදු 16 ම වැඩ කලේ බොහොම ස්ථිරසාරව නීතියට අනුකූලව..මම හැමදාමත් හිතුවෙ මගේ මහජනතාව ගැන... මම හැමදාම ඉන්නේ මගේ ආදරණිය මහජනතාව එක්ක...එකේ කිසි වෙනසක් නැහැ. බොහොම ස්තුතියි..**

**මම නිර්දෝෂයි..**

**ප්ලීස් ලුක් ආෆ්ටර් ත්‍රි ඔෆ් අස්.. අපි තුන් දෙනාව බලාගන්න..**

**මම හැමදාම ඉන්නේ මහජනතාව එක්ක. ඒකේ වෙනසක් වෙන්නේ නැහැ'**

ඇයව බලයෙන් ඉවත් කිරීම අරමුණු කරගත් දෝෂාභියෝග විවාදය, අධිකරණ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය රට තුළ උල්ලංඝනය වෙමින් පවතින ආකාරය ඇතුළු අසීරු ප්‍රශ්න ගණනාවක් ගෙන හැර දැක්වීය. මේ ක්‍රියාවත් සමග, ප්‍රජාතන්ත්‍රවාදී රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ස්වභාවයම දැඩි සෝදිසි ඇසට ලක්ව තිබේ. ජනවාරි 15 වැනිදා ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශකයා අන්තර්ජාතික සැලකිල්ලට හඬක් ලබාදෙමින්, ශ්‍රී ලංකාව තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී රටක්දැයි සැක පහළ කළේය. ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මිය බලයෙන් ඉවත් කිරීම මෙන්ම නව අගවිනිසුරුවරයෙකු පත් කිරීම ද ලොව පුරා හෙළා දැකීම ට ලක්විය. අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය වැනි පොදු රාජ්‍ය මණ්ඩලයීය සාරධර්මයන් සමග ශ්‍රී ලංකාව එකඟදැයි පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් ඇතුළු සෙසු අන්තර්ජාතික මුලපිරීම් විසින් විමසනු ලැබීය.

ශ්‍රී ලංකාව නිදහසින් පසු මුහුණදුන් මේ විවාදය සහ පාලන තන්ත්‍රය එයින් ලක්වූ ලැජ්ජාව, ශ්‍රී ලංකාවේ පමණක් නොව අන්තර්ජාතික ප්‍රජාව තුළ ද පහසුවෙන් නොමියේ. එසේම ආචාර්ය ශිරානි බණ්ඩාරනායක හට පැවසීමට ඇති දෙය ද තවදුරටත් ගැටලු ඇති කරනු ඇත.

කෙටියෙන් පවසන්නේ නම් ඇය දේශීය වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද රාජපක්ෂ ආණ්ඩුවට ලැජ්ජාවකි. මෙහිදී සැලකිල්ලට ගත යුතු දෙය වන්නේ, රාජපක්ෂ රෙජීමය සහ විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය, අතීතයේ මෙබඳු ගැටලු ඇති කළවුන් පහසුවෙන් අමතක කර නොමැති වීමයි. සිය විරුද්ධවාදීන් සමග ප්‍රචණ්ඩකාරී ලෙස ගනුදෙනු කිරීම මේ රෙජීමය දිගින් දිගටම අනුගමනය කරමින් සිටින ප්‍රතිපත්තියකි. ආචාර්ය බණ්ඩාරනායක සහ ඇගේ පවුලේ අයවලුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අප නැගී සිටිය යුත්තේ එනිසා ය.

හෝරාවේ අවශ්‍යතාවය වන්නේ "අප තිදෙනා බලාගන්න" නමැති ඇගේ ඉල්ලීමට ශ්‍රී ලංකා ජනතාව මෙන්ම අන්තර්ජාතික ප්‍රජාව ද ප්‍රතිචාරයක් දැක්වීමයි. අධිකරණය සම්බන්ධයෙන් මේ රෙජීමය හැසිරී තිබෙන රෞද්‍ර ලීලාව මෙන්ම ඇගේ නිවස අසල ඔවුන් හැසිරුණු ලීලාව ද විසින්, ඇයව නිහඬ කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ චේතනාව පැහැදිලි කර තිබේ.

අප විසින් කළ යුතු දෙය 'ද සන්ඩේ ලීඩර්' හි හිටපු කර්තෘ ෆෙඩ්‍රිකා ජැන්ස් විසින් වඩාත්ම හොඳින් කියා තිබේ. ඇයට අනුව අපට අවශ්‍යව තිබෙන්නේ මියගිය වීරවරියක නොව එළඹෙන වර්ෂවලදී ඇගේ පවුල සහ සමාජය වෙත දායක විය හැකි ජීවමාන තැනැත්තෙකි.

\- **Ethics in Action**



# අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක විසින් සිය ධුරයෙන් බලයෙන් ඉවත් කිරීම සම්බන්ධව මාධ්‍යවලට ලබාදුන් ප්‍රකාශය

*මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හතළිස් තුන්වන අග්‍රවිනිශ්චයකාරවරිය වෙමි.*

*අග්‍රවිනිශ්චයකාරවරිය වශයෙන් මේ රටේ විනිශ්චයකාරවරුන්, නීතිඥයන් සහ පුරවැසියන් උදෙසා වූ නොසැලෙන වගකීමක් මා වෙත තිබේ.මා අද ඔබ ඉදිරියේ නැගී සිටින්නේ අසාධාරණ ලෙස පීඩනයට, අපවාදයට හා හෙළාදැකීමට පත්කරනුලබමිනි. පසුගිය සති කිහිපය තුළ මා වෙත දක්වන ලද සැලකීම්, ජනරජයෙහි අග්‍රවිනිශ්චයකාරවරිය තබා සාමාන්‍ය පුරවැසියකුවත් නොලැබිය යුතු තරම් වේදනාකාරී ඒවාය. අවුරුදු පනස් හතරක මගේ ජීවිත කාලයෙන් අවුරුදු තිස් දෙකක් අඛණ්ඩව කොළඹ විශ්වවිද්‍යාලය හා ශ්‍රේෂ්ඨාධිකරණය මගින් මම මගේ මව්බිම වෙනුවෙන් සේවය කර ඇත්තෙමි. අවාසනාවකට ඒ වෙනුවෙන් මට ලැබුණු තෑග්ග නම් මේ අයුක්තිසහගත සැලකිල්ලයි. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් චෝදනාවන්ට ලක්කොට අසාධාරණ හා අත්තනෝමතික ලෙස වරදකාරිය කරනු ලැබූවද, නීතිය ඉදිරියේ මම නිවැරදිකාරිය කරනු ලැබ ඇත්තෙමි. එම තීරණයන්,මට අඛණ්ඩව මගපෙන්වන හා මාද බලවත් ලෙස විශ්වාස කරන ස්වාභාවික යුක්තියේ මූලධර්ම හා නීතියේ නිසි ක්‍රියාදාමය අනුගමනය කරමින් එම උපරිමාධිකරණ විසින් ලබාදුන් ඒවා වීම මට මහත් අස්වැසිල්ලක් ගෙනදෙයි. ගරු කථානායකවරයාද පිළිගත් පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති එකම සහ අනන්‍ය බලය සහිත අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය, පසුගියදා ලබා දුන් අර්ථනිරූපණය මගින් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවත් එහි ක්‍රියාපිළිවෙලත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී හා නීති විරෝධී බවට පැහැදිලිව ප්‍රකාශ කළේය. ඊට අමතරව, අභියාචනාධිකරණය විසින් විශේෂ පාර්ලිමේන්තු කාරක සභාවෙහි තීරණය රිට් ආඥාවක් මගින් අවලංගු කරන ලදි. ඒ අනුව, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ තීරණය නීතියට පිටින් ගිය, ශූන්‍ය හා බලරහිත එකකි. ඊට නීතිය ඉදිරියේ කිසිදු බලයක් හෝ වලංගුභාවයක් හෝ නැත. පාර්ලිමේන්තුව විසින් යොදාගන්නා ලද ක්‍රියාදාමයද බෙහෙවින් දෝෂ සහගතය. මේ කරුණු මත, නීතියේ ආධිපත්‍යය මූලික පදනම වූ සහ මූලික නිදහස පවතින, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස හඳුන්වනු ලබන මාගේ රටෙහි තවමත් නිසි ලෙස පත්කරන ලද නීත්‍යනුකූල අග්‍රවිනිශ්චයකාරවරිය මම වෙමි.*


මේ ක්‍රියාදාමය තුළ අග්‍රවිනිශ්චයකාර ධුරය පමණක් නොව අධිකරණයේ ස්වාධීනත්වයද බලහත්කාරයෙන් පැහැරගෙන තිබේ. නීතියේ පාලනය, නීතිය අනුගමනය කිරීම හා ස්වාභාවික යුක්තියේ මූලධර්ම යන සංකල්පයන් පිටමංකර ඇතිවා පමණක් නොව කෲර ලෙස විකෘති කොට තිබේ. මා පීඩාවට පත්කොට ඇත්තේ ස්වාධීන අධිකරණයක් වෙනුවෙන් සහ, අනිසි බලපෑම්වලට එරෙහිව මා පෙනීසිටි නිසාය. ජනතාව උත්තරීතර වන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතියේ පාලනය පිළිගන්නා ජනරජයක නීතියේ ආධිපත්‍යය පැවතුණේ නම් මෙවැනි අසාධාරණ ලෙස මා දඬුවම් නොලබනු ඇත.

මට විරුද්ධව නගා ඇති චෝදනා මුළුමනින්ම අසත්‍යය. සියලු චෝදනාවන්ට මා සම්පූර්ණයෙන්ම නිවැරදිකාරිය වන අතර, එකී චෝදනාවල සත්‍යයේ අංශුමාත්‍රයක් හෝ පැවතුණේ නම් අග්‍රවිනිශ්චයකාර ධුරයෙහි, මෙම උත්තරීතර තනතුරෙහි මා මොහොතක් වත් රැඳීසිටින්නේ නැත. අග්‍රවිනිශ්චයකාරවරිය හැටියටත්, පුරවැසියකු සහ කාන්තාවක හැටියටත් ඔබ ඉදිරියෙහි නැගීසිටින්නට මට හැකිවී තිබෙන්නේ මගේ නිවැරදිභාවය නිසාය. තවදුරටත් නිල නිවසෙහි හෝ නිල මැදිරියෙහි හෝ මා රැඳීසිටියහොත් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදුවීමට බෙහෙවින් ඉඩ ඇති බැවින්, නිල මැදිරියෙන් හා නිල නිවසෙන් ඉවත්වීමට තීරණය කළෙමි. රටේ අහිංසක ජනතාව, විනිසුරුවරුන් කනිෂ්ඨ නීතිඥවරුන් සහ මීට කැපවුණු පුද්ගලයන් වෙත ප්‍රචණ්ඩත්වය එල්ලවීම වැළැක්වීම එහි අරමුණයි.මාගේ අවුරුදු දහසයක ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජීවිතය මා කැපකර තිබෙන්නේ මේ රටේ, මිනිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකිරීම සඳහාය. මගේ උපරිම හැකියාවෙන් මිනිසුන්ගේ ජීවිත හා මිනිසුන්ගේ නිදහස, දරුවන්ගේ නිදහස, දරුවන්ගේ අධ්‍යාපනය සුරක්ෂිත කිරීම මගේ අවංක වගකීම ලෙස මම හැමවිටම සැලකුවෙමි. එමෙන්ම මම ඒ උදෙසා කටයුතු කළෙමි.

අධිකරණයේ ස්වාධීනත්වය යන ශ්‍රේෂ්ඨ පරමාර්ථය වෙනුවෙන් මා සමග කටයුතු කළ සියලුම දෙනාට මම ස්තුතිවන්ත වෙමි. මට මේ මොහොතේ සාධාරණයක් ඉටුනොවුවත් ස්වභාවධර්මයත් කාලයත් මට යම් දිනයක සාධාරණය ඉටුකරනු ඇත. බොහෝදෙනා පැමිණෙති. බොහෝදෙනා නික්ම යති. තනතුරෙහි රැඳීසිටින පුද්ගලයා කවර අවස්ථාවකවත් වැදගත් නොවේ. වැදගත් වන්නේ අධිකරණයෙහි ස්වාධීනත්වයේ අඛණ්ඩ පැවැත්මයි.

ස්තුතියි
ආචාර්ය ශිරාණි ඒ. බණ්ඩාරනායක
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ හතළිස් තුන්වන අග්‍රවිනිශ්චයකාරවරිය.
2013-01-15

අධිකරණයේ ස්වාධීනත්වය යන ශ්‍රේෂ්ඨ පරමාර්ථය වෙනුවෙන් මා සමග කටයුතු කළ සියලුම දෙනාට මම ස්තුතිවන්ත වෙමි. මට මේ මොහොතේ සාධාරණයක් ඉටුනොවුවත් ස්වභාව ධර්මයත් කාලයත් මට යම් දිනයක සාධාරණය ඉටුකරනු ඇත. බොහෝදෙනා පැමිණෙති. බොහෝදෙනා නික්ම යති. තනතුරෙහි රැඳීසිටින පුද්ගලයා කවර අවස්ථාවකවත් වැදගත් නොවේ. වැදගත් වන්නේ අධිකරණයෙහි ස්වාධීනත්වයේ අඛණ්ඩ පැවැත්මයි.



- ආචාර්ය ශිරාණි ඒ. බණ්ඩාරනායක

**2013 ජනවාරි 13 වැනි දින ආචාර්ය ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත් කළ දිනයේ ආසියානු මානව හිමිකම් කොමිසම සිදුකළ ප්‍රකාශය**

# අද, 1978 ආණ්ඩු ක්‍රමයේ අරමුණ ඉෂ්ට සිද්ධ වූ දිනයයි

අද, ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් ආචාර්ය ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ඉවත්කිරීමේ නිවේදනයට අත්සන් කිරීමත් සමග 1978 ආණ්ඩු ක්‍රමයේ අරමුණ ඉෂ්ට සිද්ධ වේ.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීතියේ ආධිපත්‍යය සහ විධායක ජනාධිපතිවරයාගේ පරම බලය අතර අරගලයේ නියෝජනයකි. 1978 වර්ෂයේ පැවති ඓතිහාසික වටපිටාව මෙකී ආණ්ඩු ක්‍රමය ඉෂ්ටසිද්ධ කිරීම සඳහා සුදුසු නොවීය. එයින් 34 වසරකට පසු, පසුගිය සමයේ සිදුවූ සියලු ධනාත්මක ගුණාංගයන්ගේ සිදුවූ ප්‍රගතිගාමී පිරිහීමත් සමග 1978 ආණ්ඩු ක්‍රමයේ අවසන් අභිමතාර්ථය ඉටුවී තිබේ. දැන්, තාර්කික පද්ධතියක් වශයෙන් නීතියේ ආධිපත්‍යයේ පැවැත්ම සඳහා පදනමක් නොමැත්තේ, මූලික සිද්ධාන්තයන් දෙක වන බලතල බෙදීම සහ අධිකරණයේ ස්වාධීනත්වය තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකි නිසා ය.

පැවති ක්‍රමය 1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් දුබල කර තිබීම නොතකා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ, නීතියේ ආධිපත්‍යය ක්‍රමය සඳහා ශක්තිමත් ලෙස දිරිදෙන බලවේගයන් ගණනාවක් විය. ඒ අතරින් පළමුවැන්න සහ සියල්ලටම ඉහළින් පැවති දෙය වූයේ, නීතියේ ආධිපත්‍යය ට ගරුකිරීමේ දීර්ඝ සහ චිරස්ථායි පරිචයන් තුළින් එය බිහිකරනු ලැබුවේ යැයි මිනිසුන් අතර පැවති හැඟීමයි. බ්‍රිතාන්‍යයන් විසින් නීතිය හඳුන්වාදුන්නේ ශ්‍රී ලාංකික සමාජයේ සංවිධානාත්මක මූලධර්මය ලෙසිනි. ජීවිතයේ සෑම අංගයක් සඳහාම පාහේ ඔවුන් විසින් නීතිය හඳුන්වාදුන් අතර, ශ්‍රී ලංකාවේ සියලු ආයතන ධාවනය වූ රේල්පීලි සංස්ථාපන කරනු ලැබුවේ මෙකී නීති මගිනි.

34 වසරකට අධික කාලයක් මුළුල්ලේ සිය සමාජයේ වූ සියලු මූලික ආයතන බිඳවැටෙන ආකාරය ශ්‍රී ලාංකිකයෝ සියැසින් දුටුවහ. මෙකී ආයතනවල බිඳවැටීමෙන් අදහස් වන්නේ, එම ආයතන සංවිධානය වූ සහ ක්‍රියාත්මක වූ මූලික නීති ප්‍රතිපත්තීන් ට බරපතළ ලෙස හානි සිදුවන බවයි. ශ්‍රී ලංකා පොලිස් ක්‍රමය, මහජන සේවා කොමිසම, මැතිවරණ කොමිසම, අල්ලස් සහ දූෂණ පාලන ක්‍රමවේදය සහ නීතිපති දෙපාර්තමේන්තුව එසේ බිඳවැටුණු ආයතන අතර වේ. මෙම ආයතනවල බිඳවැටීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පිළිගත්තේ 17 වන සංශෝධන හරහා එම ආයතනවලට යම්කිසි ජීවයක් ලබාදීමට ඔවුන් සීමාසහිත ලෙස උත්සාහ කරන විට ය. 18 වන සංශෝධනය සම්මත කරගන්නා විට එම ගළවාගැනීමේ පරිශ්‍රමය අත්හැර දැමුණු අතර, බහුපක්ෂ ක්‍රමයක් පැවතීමේ සම්භාවිතාවය සහ නියමාකාරයෙන් තෝරාපත්කර ගත් ව්‍යවස්ථාදායකයක් පැවතීමේ සම්භාවිතාවය අවසන් විය.

1978 දී නීතියේ ආධිපත්‍ය ක්‍රමය ට සහයෝගය දක්වන අනිවාර්ය සහ විවේචනාත්මක බුද්ධිමතුන් පිරිසක් ද විය. විනිසුරුවරුන් ඒ වන විටත් "පැරණි-හොඳ ක්‍රමය" ට අයත්වූවන් වූ අතර එනිසා නීතීඥවරු ද එසේ වූහ. නමුත් ගතවූ 34 වසර පුරා ආකාර ගණනාවකින් අධිකරණය ට රහසින් සහ හිතාමතා පීඩා කරන ලද අතර කර්තෘවරුන් ගණනාවක් විසින් ඒවා ඉතා හොඳින් වාර්තා කිරීම සහ විවේචනය කිරීම ද

සිදුකරන ලදී. අධිකරණයට හිතාමතා පීඩා පමුණුවන විට, සිදුවෙමින් පවතින භූමිකම්පාවේ ස්වභාවය නීතිඥවරු අත්දුටුවහ. එසේම මේ ක්‍රමය තුළ නොනැසී සිටීමට අවශ්‍ය වූ අයට නව පරිසරය ට හැඩගැනීම අවශ්‍ය විය.

34 වසරකට අධික කාලයක් මුළුල්ලේ සිය සමාජයේ වූ සියලු මූලික ආයතන බිඳවැටෙන ආකාරය ශ්‍රී ලාංකිකයෝ සියැසින් දුටුවහ. මෙකී ආයතනවල බිඳවැටීමෙන් අදහස් වන්නේ, එම ආයතන සංවිධානය වූ සහ ක්‍රියාත්මක වූ මූලික නීති ප්‍රතිපත්තීන් ට බරපතළ ලෙස හානි සිදුවන බවයි. ශ්‍රී ලංකා පොලිස් ක්‍රමය, මහජන සේවා කොමිසම, මැතිවරණ කොමිසම, අල්ලස් සහ දූෂණ පාලන ක්‍රමවේදය සහ නීතිපති දෙපාර්තමේන්තුව එසේ බිඳවැටුණු ආයතන අතර වේ.

කෙසේ නමුත්, අධිකරණයට සහ නෛතික පරිචයන් වෙත අත් සෑම දෙයකට ම පෙරාතුව රහසින් පීඩාකළ හේතුව වූයේ, විධායක ජනාධිපතිවරයාගේ අත්තනෝමතික බලය හරහා නෛතික පද්ධතියට හානි සිදුකළ එවකට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරනතුංග සහ එවකට අගවිනිසුරු සරත් නන්ද සිල්වා අතර පැවති සක්‍රිය සහයෝගිතාවයයි. ශ්‍රී ලංකාවේ අධිකරණ පරිචයේ සෑම අංගයක් ම දුෂ්ට ලෙස මෙහෙයවමින් එස් එන් ද සිල්වා සමස්ත ක්‍රමය වෙත මාරක පහර එල්ල කළේය. නීතියේ කාර්යපටිපාටික අංගය ඔහු විසින් දරුණු ලෙස නොතකා හැරියේය. නීතියේ සැලකිය යුතු අංගයක් ලෙස කාර්යපටිපාටික නීතිය පවතින තාක් කල් නීතියේ ආධිපත්‍යය නීතියේ ආධිපත්‍යය ඉතිරි වී පවතියි. මේ නිසා සියලු ඇණ සහ මුරිච්චි බුරුල් වූ අතර මේ ක්‍රමයට තවදුටත් ඉදිරියට යා නොහැකි තත්වයක් මතුවිය.

කෙසේ නමුත්, නිල වශයෙන්, අධිකරණයේ ස්වාධීනත්වය වචනයට පමණක් සීමා වී කියැවුණු අතර, අභ්‍යන්තර ක්‍රමය මහත් උපද්‍රවයකට ලක්ව තිබියදී බැලූ බැල්මට පමණක් ඒ වෙත ගෞරවයක් ඉතිරි ව පැවතිණි.

දෝෂාභියෝගය සහ එය ගෙන ගිය ස්වභාවය විසින් මේ තිරය ඉවත් කෙරිණි. අවසන් හෝරාව එළඹ ඇති බව බොහෝ ප්‍රමාද වී වටහාගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය, ඓතිහාසික විනිශ්චයන් ලෙස ඉදිරියටත් ශේෂ වී පවතින ආකාරයේ විනිශ්චයන් මගින් සිය ක්‍රමය රැක ගැනීම සඳහා පරිශ්‍රමයක් දැරීය.

නීතිඥවරු ද විනිසුරුවරු ද පෙර කිසිදා දැකගන්නට නොලැබුණු එක්සත්භාවයකින් යුතු ව රැස්වූහ. එය හරියට, සිය හිතවතුන් අතරින් අයෙක් බරපතළ ලෙස රෝගාතුර වී සිටින බව වටහාගනිමින් සියලු ඥාතීන් එකට එක්රැස්වීමක් මෙනි. ඔවුහු අවසන් මොහොතේ යම්කිසි ප්‍රකට මැදිහත්වීමක් සිදුකිරීමට උත්සාහ කළහ.

කෙසේ නමුත්, ක්‍රමය මරා දැමීමට උවමනා වූ අයට අවැසි වූයේ එය පසුව නොව ඉක්මනින්ම මරාදැමීමට ය. 17 වන සංශෝධනය මගින් සිදුකිරීමට ගිය ගළවාගැනීමේ මෙහෙයුම මැඬපැවැත්වූ හස්තයම විසින් දැන් අධිකරණ ස්වාධීනත්වයේ සහ නීතියේ ආධිපත්‍යයේ වියෝග ප්‍රකාශය ට තීරණාත්මක ලෙස අත්සන් කර තිබේ.

ශ්‍රී ලාංකිකයන් දැන් මුහුණදෙනු ඇත්තේ සපුරා ම අලුත් තත්වයක ට ය. පසුගිය ලිපි සහ ප්‍රකාශවලින් අප උත්සාහ කර තිබෙන්නේ සමස්තයක්

වශයෙන් ශ්‍රී ලාංකික සමාජය සඳහා සහ සියලු ශ්‍රී ලාංකික ආයතන ඉදිරියේදී බලාපොරොත්තු විය යුත්තේ මොනවාද යන්න පිළිබඳ ව සංක්ෂිප්ත වශයෙන් දැක්වීමට ය.

පිළිතුරුදීම සඳහා ඉතිරි ව තිබෙන ප්‍රශ්නය වන්නේ, ශ්‍රී ලංකාවේ මිනිසුන් සිය ස්වාධීනත්වයන් ආරක්ෂා කරන නීති ක්‍රමයක් යටතේ ජීවත්වීමට මග සොයාගනු ඇත්තේ කෙසේද යන්නයි.

ප්‍රංශ, බ්‍රිතාන්‍ය, ඇමරිකානු සහ ස්වාධීනත්වයේ හොඳම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්ප්‍රදායයන් ට පදනම් වූ ජෝන් ලොක්, බැරන් ඩි මොන්ටෙස්ක්‍යු, ජීන් ජේකස් රූසෝ සහ සෙසු අයගේ අදහස් මත පදනම් වූ ක්‍රමය අදින් අවසන් වෙයි.

ශ්‍රී ලංකාව දැන් අත්දකින්නේ ලොව පුරා සම්ප්‍රදායික පදනම් ද සහිත වන බලාධිකාරිය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම යි.

ශ්‍රී ලංකාවේ වර්තමාන සහ අනාගත පරම්පරාවන් හට රාජ්‍ය විසින් සුරකිනු ලබන සිය ස්වාධීනත්වයන් භුක්තිවිඳීම පිළිබඳ තේරුම් බේරුම් කර ගන්නට දැන් මගක් නැත.


ශ්‍රී ලංකාවේ වර්තමාන සහ අනාගත පරම්පරාවන් හට රාජ්‍ය විසින් සුරකිනු ලබන සිය ස්වාධීනත්වයන් භුක්තිවිඳීම පිළිබඳ තේරුම් බේරුම් කර ගන්නට දැන් මගක් නැත.

නමුත් අඩුපාඩුකම් සහිත වූ "පැරණි-හොඳ ක්‍රමය", ස්වාධීනත්වයේ ගෝලීය සම්ප්‍රදායයන් මත පදනම් වූ එකක් විය. ඉදිරියේදී සිදුවනු ඇත්තේ මෙම සම්ප්‍රදායට ප්‍රතිවිරුද්ධ දෙයයි.

ඇතැම්විට බලාපොරොත්තුවේ මූලය ලියෝ තෝල්ස්තෝයි ගේ "වට් මෙන් ලයිව් බයි"කෙටිකතාව විය හැකිය. එය මෙවැනි අවස්ථාවක කියැවීමට සුදුසු ය.

- <u>බැසිල් ප්‍රනාන්දු විසිනි.</u>

*1978 ආණ්ඩුක්‍රමය පිළිබඳ සාකච්ඡාවක් සඳහා බැසිල් ප්‍රනාන්දු ලියූ "ගයිජස්ගේ මුද්ද" කියවන්න.*







**ගයිජස්ගේ මුද්ද**
ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
Gyges' Ring by Basil Fernando හි
සිංහල අනුවාදය
ශ්‍රී ලංකාවේ බෙදාහැරීම:ස්ටැම්ෆර්ඩ් ලේක්



සිතුවම: වාල්ස් දයානන්ද

# බිය

මංකොල්ලකරුව, නතර වෙය
නීතිය කීය සැහැසියාට.

මම නුඹව බඩ සයෙන් තබමි
නුඹව කැහැටු කරමි
සැහැසියා දුන්නේය පිළිතුරු.

නීතිය වෙව්ළා ගියේය.
වේගයෙන් ඇසිපිය ගැසීය.

නීතියේ මුහුණේ
බිය දුටු සැහැසියා
නීතියට පහර දී
දඟගෙයි දැමීය.

- බැසිල් ප්‍රනාන්දු



# අදෘෂ්‍යමාන මුද්ද පිළිබඳ ග්ලව්කන්ගේ කතාන්දරය සහ ජේ.ආර්. ජයවර්ධනගේ බූදලය

ප්ලේටෝ ගේ *රිපබ්ලික්* හි අදෘෂ්‍යමාන මුද්දක් පිළිබඳ කතාන්දරයක් ග්ලව්කන් පවසයි. මුද්ද සොයාගත් මිනිසා ඔහුගේ බලය යොදවා රජ මාළිගයට ඇතුල් වෙයි. රැජින දූෂණය කරයි. රජු මරා කිරුළ ගනියි.

*අපට ඇසෙන පරිදි විශේෂයෙන්ම, ලිඩියා හි ගයිජස් ගේ මුතුන්මිත්තෙක් වරක් ලබාගත්තා වැනි බලයක් ඔවුන් ලබාගෙන තිබුණා නම් මා කතා කරන ඉඩ අවකාශය ඔවුන් ට තිබෙන්නට ඉඩ තිබිණි. ඔහු එවකට සිටි ලිඩියානු පාලකයා හට සේවය කළ එඬේරෙකු විය. දැවැන්ත වැසි කුණාටුවක් ඇතිවූ පසු සහ භූමි කම්පාවක් සිදු වී කිසියම් දුරක ට පොළොව විවර වූ පසු ඔහුගේ අශ්වයන් කුරගාන සීමාවේ පොළොවේ පැල්මක් ඇති වී තිබිණි. එය දැකුමෙන් ඔහු ප්‍රීතියෙන් පිනා ගියේය. පොළොවේ පැල්ම තුළ ට ගමන් කළේය. කතාන්දරය ගලා යන හැටියට, සෙසු මෙවලම් අතර ලෝකඩ අශ්වයෙකු ඔහු දිටීය. එය තුළ කුහරයකි. කවුළු සවිකර තිබිණි. ඔහු ඉදිරියට නැමී ඒ කවුළු තුළින් බැලූ විට එතුළ මළ කඳක් දිටීය. මළ කඳ යෝධයෙකුගේ සේ ය. එය නිරුවත් නමුත් එක් ඇඟිල්ලක රන් මුදුවක් විය. ඔහු ඇඟිල්ලෙන් මුදුව ගළවා ගෙන එයින් පිටවී ආවේය.*

*රජුට ඔහුගේ අසුන් රංචුව ගැන දැනුම් දෙනුවස් මසකට වරක් සියලු එඬේරුන් එකිනෙකා මුණගැසීමට පුරුදු වී සිටියහ. අපගේ කතා නායකයාද මුදුව පැළඳගෙන එතැනට ආයේය. සෙස්සන් අතර ඔහු වාඩිවී සිටින අතර ඔහුගේ සිරුර දෙසට වන්නට පිහිටි, මුදුවේ ඇළවූ මුවහත අතෙහි ඇතුළු කොටස දෙසට වන්නට කරකවා ගත්තේය. මෙය කළ විට ඔහු ස්වකීය අසල්වාසීන් හට අදෘෂ්‍යමාන වූ අතර ඔහුගේ මහත් පුදුමයට හේතු වෙමින්, ඔහු එතැනින් ගියේදැයි ඔහු අසල සිටියෝ කතා බහ කරන්නට පටන් ගත්හ. මුද්දෙහි ඇළවූ මුවහත නැවත පිට පැත්තට කැරකවූ විට ඔහු නැවතත් දෘෂ්‍යමාන විය. මේ ගැන කල්පනා කළ ඔහු එම බලය තිබෙන්නේ මුද්දේ දැයි නැවතත් පරීක්ෂා කළේය. මේ ක්‍රමයෙන්, මුද්දේ ඇළ වූ මුවහත ඇතුළ ට කරකවන විට තමන් අදෘෂ්‍යමාන වන බවත් නැවත එය පිටතට කරකවන විට තමන් ව දෘෂ්‍යමාන වන බවත් සොයාගත්තේය. මෙය වටහාගත් සැණින් රජුගේ නියෝජිතයෙකු බවට පත්වීමට සියල්ල සූදානම් කරගත් ඔහු ඒ ක්‍රමයෙන් රජ මාළිගය තුළ ට ඇතුළු විය. එසේ ඇතුළු වූ විගස ම ඔහු රජුගේ භාර්යාව දූෂණය කර ඇගේ උපකාරයෙන් රජු ට පහර දී මරා දමා ඉක්බිති කිරීටයේ භුක්තිය හිමිකර ගත්තේය.*

**- ප්ලේටෝ ද රිපබ්ලික්- රොබින් වෝටර්ෆීල්ඩ් ගේ නව පරිවර්තනයක්**



පහත දැක්වෙන සංවාදය මගින් ඉහත කතාන්දරය 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මෙම සාකච්ඡාව ට අදාළ වන ආකාරය විදහා දැක්වේ.

මෙය මනඃකල්පිත චරිත කිහිපයක් අතර සිදුවන සංවාදයකි. මෙකී මනඃකල්පිත චරිත මගින් කිසිදු ජීවමාන පුද්ගලයෙකු නියෝජනය නොවේ.

## <u>චරිත</u>

- *මාධ්‍යවේදියෙක්, සාකච්ඡාව මෙහෙයවමින්.*
- *අනන්‍යතාවය හෙළි නොකිරීමේ පදනම මත කතා කිරීමට එකඟ වූ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක්.*
- *විශ්‍රාමලත් විනිසුරුවරයෙක්.*
- *දේශපාලන විද්‍යාඥයෙක්.*
- *දාර්ශනිකයෙක්.*

**මාධ්‍යවේදියා :** මේ වන විට අපි අපේ රටේ වැදගත් පරිණාමනයන්ගෙන් සමහරක් සාකච්ඡා කරල තියෙනවා. අපි දැන්, අපේ දේශීය අත්දැකීමේ කොටසක් විදිහට, පළඳින කෙනා ව අදෘෂ්‍යමාන කරන ගයිජස් ගේ මුද්ද ගැන සාකච්ඡා කළා. මේ පරිණාමනයෙදි 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සුවිශේෂී භූමිකාවක් රඟපෑවා. දැන්, විධායක ජනාධිපතිවරයා ට ගයිජස්ගේ මුද්ද පළඳින්න පුළුවන්. ඒකෙන් කරන්නෙ ඔහුව සම්පූර්ණයෙන්ම අදෘෂ්‍යමාන කරන එකයි. අපි මේ ගැන තව ටිකක් කතා කරමු.

**දාර්ශනිකයා :** මේ මට්ටමේදි මම හිතනවා, අපි ගයිජස් ගෙ මුද්ද ගැන පුරාවෘත්තය නැවත මෙනෙහි කළොත් හොඳයි කියලා. පුරාවෘත්තය ට අනුව ලිඩියා හි ගයිජස් ගෙ මුතුන්මිත්තා ලිඩියා හි ක්ලෝඩියස් රජතුමා ට සේවය කෙරුව එඬේරෙක්. භූමිකම්පාවකට පස්සෙ ගයිජස් ගෙ සතුන් ගෙනයන කඳුකරයෙන්

ගල්ගුහාවක් මතුවුණා. ගල්ගුහාව ට ඇතුළුවුණා ම ගයිජස් ට ඇත්ත වශයෙන් ම හොයාගන්න ලැබුණෙ සොහොනක්. මිනිහෙකු ට වඩා ලොකු මළ කඳක් එක්ක ලෝකඩ අශ්වයෙක්. මළ කඳේ ඇඟිල්ලක තිබුණු මුද්ද ගයිජස් සාක්කුවෙ දාගත්තා. මුද්ද සීරුමාරු කළාම තමන් ට නොපෙනී යාමේ බලය ලැබෙනවයි කියල ගයිජස් හොයාගත්තා. ඊට පස්සෙ රජ්ජුරුවන්ගෙ සත්තු ගැන දැනුම් දෙන පණිවිඩකාරයෙක් වගේ ගයිජස් මාළිගයට ගියා. මාළිගයට ඇතුල් වුණා ට පස්සෙ ගයිජස් ඔහුගෙ අදෘෂ්‍යමාන වීමේ අලුත් බලය පාවිච්චි කරලා රැජින ව දූෂණය කළා. ඇගේ උදව්වෙන් රජු ව මැරෙව්වා. ඊට පස්සෙ ලිඩියාවෙ රජ්ජුරුවො බවට පත්වුණා. ධනය ට ප්‍රසිද්ධ වුණු ක්‍රොයෙසස් රජු තමයි ගයිජස්ගෙන් පැවතගෙන එන කෙනා.

**දේශපාලන විද්‍යාඥයා :** දැන්, මේ කතාන්දරයෙ ආදර්ශය තමයි, සාමාන්‍ය මිනිහෙකු ට තමන්ගෙ ක්‍රියාවන්ගෙ විපාක ගැන බයක් නැත්නම් ඔහුට හෝ ඇයට සදාචාරයක් නැහැ කියන එක. කාට හරි නොපෙනී යන්න පුළුවන් නම්, නරක ආරංචි පැතිරෙන නිසා හරි නරක විපාක ඇතිවෙයි කියල හරි කරන්න බැරි දේවල් කරන්න ඒ කෙනාට පුළුවන්.

**විශ්‍රාමලත් පොලිස් නිලධාරියා :** මං හිතන්නෙ මට මේ පුරාවෘත්තයයි ඒකෙන් කියන්න උත්සාහ කරන දේයි තේරෙනවා. ඒත් අපි අපේ නිලධාරීන් ව හෝ නායකයන් ව මේ කතාන්දරයෙ ආදර්ශය පිළිපදින්න කියල දිරිමත් කළ යුතුයි කියන දේට මම එකඟ නෑ.

**දේශපාලන විද්‍යාඥයා :** ඔබ කියන්නෙ ඒක බටහිරකරණය වෙලා වැඩියි කියලද?

**විශ්‍රාමලත් පොලිස් නිලධාරියා :** මං අදහස් කරන්නෙ, අපිට දෘෂ්‍යමාන වෙන්න සිද්ධ වුණොත් කිසිම දෙයක් කරගන්න බැරිවෙනවා. අපි නිකම් බලයක් නැති අය වෙනවා. එහෙම වුණොත් අපි කොහොමද අපේ නිලධාරීන් ට කියන්නෙ අපි අකමැති මිනිස්සුන් ව, දරුණු අපරාධකාරයන් ව මරන්න කියලා? ඒක ඔවුන් ට එළිපිට ම කරන්න වුණොත්? මේ දේවල් අපේ අඹු දරුවො දැනගත්තොත් ඒ අය හිතයි අපි නරක මිනිස්සු කියලා. සාමාන්‍ය ජනතාව ආදර්ශවලින් ඉගෙන ගන්න ඕනෙ තමයි. ඒත් අපි කරන දේවල් සාමාන්‍ය ජනතාව දන්නව නම් ඒ අය අපිව ඉක්මවලා අපේ තැන ගන්න බලයි. එතකොට ප්‍රශ්න වැඩි වෙනවා. අපිට අදෘෂ්‍යමාන විදිහට ගොඩක් දේවල් කරන්න උවමනා වෙනවා.

**විශ්‍රාමලත් අධිකරණ නිලධාරියා :** සමහර කෙනෙක් කියන්න පුළුවන් අපේ පොලිස් නිලධාරියා කියන දේවල් වැරදියි කියලා. කොහොම වුණත්, ඔහු සරලව අවංකව කිව්වෙ සිද්ධවෙන්නෙ මොනවද කියල හැම කෙනෙක් ම දන්න දේ තමයි.

**දේශපාලන විද්‍යාඥයා :** දැන්, අපි අපේ මුල් ප්‍රශ්නයට ආපහු යොමුවෙමු. 1978 දි විධායක ජනාධිපති ක්‍රමය නිර්මාණය කරද්දි ජනාධිපතිවරයා ඔහුට ම ගයිජස් ගේ මුද්ද දී ගත්තා. අපි ඉතාම බලගතු ජනාධිපති කෙනෙක් නිර්මාණය කළා. මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන දේ ලෝකෙට එන්න කලින් ලෝකය පාලනය කෙරුව රජවරු තරම් ම බලවත් ජනාධිපති කෙනෙක්. අපි බටහිර ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කරලා අපේ ම දෙයක් හදාගත්තා.

**දාර්ශනිකයා :** මං හිතන්නෙ ඔබ අදහස් කරන්නෙ, අපි, නීතිය තමයි පරම කියන අදහස අයින් කරලා ඒ වෙනුවට පරම පුද්ගලයා කියන අදහස ගෙනාවා. පුරාණ ප්‍රතිමාවන් වල දකිනව වගේ ලොකු, උස, මහත දෙහත පුද්ගලයෙක්. කවුද බලගතු පුද්ගලයා විය යුත්තේ කියන එක ඇත්ත වශයෙන් ම අපේ අදහසක්. අපේ දෙයක්.



Ring of Invisibility


''1978 දි විධායක ජනාධිපති ක්‍රමය නිර්මාණය කරද්දි ජනාධිපතිවරයා ඔහුට ම ගයිජස් ගේ මුද්ද දී ගත්තා. අපි ඉතාම බලගතු ජනාධිපති කෙනෙක් නිර්මාණය කළා. මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන දේ ලෝකෙට එන්න කලින් ලෝකය පාලනය කෙරුව රජවරු තරම් ම බලවත් ජනාධිපති කෙනෙක්. අපි බටහිර ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කරලා අපේ ම දෙයක් හදාගත්තා.''

**විශ්‍රාමලත් පොලිස් නිලධාරියා :** අපි අවංක වෙමු. වැය කරන හැම සතයක් ම පොතක ලියල තියන්න, ඒ හැම පොතක් ම විගණනයෙදි පරික්ෂා කරනවා, නිල බලය පාවිච්චි කරල තමන්ගෙ පවුලෙ අයටයි මිත්‍රයන්ටයි උදව් කරන්න බැහැ කියල අපි ජනතාවට කිව්වොත් ඔබ හිතනවද ආණ්ඩුව වෙනුවෙන් වැඩ කරන්න කියල ජනතාව නම්මගන්නයි ඉහළ නිලතල දරන්නයි අපිට පුළුවන් කියලා? අපි අපේ නිලධාරීන් ට කිව්වොත් හැම සැකකරුවෙක් ම විනිශ්චයකාරවරුන් ඉදිරියට ගේන්න, තොරතුරු නොදෙන මිනිස්සුන් ට වධ දෙන්න එපා, එහෙමත් නැත්නම් හැම මළමිනියක් ම පශ්චාත් මරණ පරීක්ෂණයක් තියන්න මහේස්ත්‍රාත් ඉදිරියට ගේන්න කියලා, ඔබ හිතනවද ඒ නිලධාරීන් කිසිම දෙයක් කරයි කියලා? මෙලෝ වැඩක් නොකරන නිලධාරීන් ට අපිට පඩි ගෙවන්න සිද්ධ වෙයි.

**විශ්‍රාමලත් අධිකරණ නිලධාරියා :** මං හිතන්නෙ ඔබ කියන්නෙ අපි මීට වඩා නම්‍යශීලී විය යුතුයි කියලයි. අපි ජනතාවට මීට වඩා නිදහසකින් බලය පාවිච්චි කරන්න ඉඩ දෙන්න ඕනෙ. බලයෙ ඉන්න අයගෙ නිදහස තමයි ඔය කියන 'ජනතාවගෙ නිදහස' ට වඩා වැදගත්. මිනිස්සු නිදහස් වෙන්නෙ ඔවුන් පාලකයන් ට කීකරුවෙලා පාලකයන් ට ගරුකරනවනම් විතරයි.

**දාර්ශනිකයා :** අපේ නිලධාරියාටයි අධිකරණ නිලධාරියාටයි අනුව මේක තමයි 1978 අවුරුද්දෙ ඉඳන් ම සිද්ධ වෙනනෙ. මේක තමයි අපේ අලුත් සාමය.

**මාධ්‍යවේදියා :** දැන් මට තේරෙනවා මේ තරම් මාධ්‍යවේදීන් ඝාතනය වෙන්නෙ ඇයි කියලා. අපි මාධ්‍යවේදියො විදිහට විනිවිද භාවයයි වගකිවයුතු භාවයයි විශ්වාස කරන නිසා අපිට මේ අලුත් සාමය යටතෙ තවදුරටත් කිසිම ඉඩක් නැහැ.



# ශ්‍රී ලංකාව විවාදයන් රහිත බිමකි

*ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ Ph.D උපාධි අපේක්ෂක නික් චීස්මන් විසින් බැසිල් ප්‍රනාන්දු ලියූ ගයිජස් ගේ මුද්ද ග්‍රන්ථයට සැපයූ පෙරවදන*

2009 වර්ෂයේදී ශ්‍රී ලංකා ජනාධිපතිවරයා බුරුමයේ සංචාරයක නියැළුණේ ය. එය හමුදා පාලනයක් සහිත එම රට වෙත මහින්ද රාජපක්ෂ ගේ පළමු නිල සංචාරය නොවීය. අග්‍රාමාත්‍යවරයා ලෙස ඊට පෙර ද ඔහු එහි පැමිණ තිබූ අතර එහිදී ඔහුගේ බුරුම ප්‍රතිමූර්තිය වන ජ්‍යෙෂ්ඨ ජනරාල් තාන් ෂ්වේ සමග හිතවත්කමක් ගොඩනංවාගෙන තිබෙන්නා සේ පෙනිණි. ජ්‍යෙෂ්ඨ ජනරාල්වරයා ද රාජපක්ෂ ව සිය රටදී හමුවීම පිණිස විරල ගණයේ විදෙස් චාරිකාවක යෙදුණේය.

මෙකී හුවමාරු සංචාරයන්, දෙරට අතර පවත්නා ඒකාධිපතිමය දේශපාලන පරිචයන්ගේ අභිසරණය වීමක් පිළිබඳ ඇතැමුන් හට සනිටුහන් කළේය. අන්තර්ජාතික ගැටලුවල බල ක්‍රීඩාවන්වලදී පොදු ආත්මාර්ථය පිළිබඳ හැඟීමෙන් යුතු යම්කිසි ආකාරයක අමනෝඥ සහ අවලක්ෂණ සමානතාවයන් වලට වඩා, ඓතිහාසික හා ආයතනික සමාන්තරයන් සමග ඒකාධිපතීන් දෙදෙනා අතර වන සැබෑ අභිසරණය ට කිරීමට තවත් දේ තිබේ.

බැසිල් ප්‍රනාන්දු ගේ කාලෝචිත රචනා එකතුව- *Gyges' Ring: The 1978 Constitution of Sri Lanka -"ගයිජස් ගේ මුද්ද- ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව"* තවදුරටත් කියවීමේදී මෙකී අභිසරණයෙහි සැබෑ චරිතය වැඩි වැඩියෙන් මා හට දෘෂ්‍යමාන වන්නට පටන් ගත්තේය.

*ගයිජස් ගේ මුද්ද* හි බැසිල් ගේ හැඳින්වීමෙහි ඔහු, 1930 දශකයේ පටන් ශ්‍රී ලංකාව දුගී බව තුරන් කිරීමෙහි, සෞඛ්‍යය හා අධ්‍යාපනයෙහි අත්කරගත් විශාල ජයග්‍රහණයන් පිළිබඳ අමර්තියා සෙන් ව උපුටා දක්වයි. මෙකී ජයග්‍රහණ අහම්බෙන් සිදුවූ දේ නොවන බව ඔහු හුවා දක්වයි. ඒවා යථාර්ථයන් බවට පත්කළේ ශක්තිමත් නෛතික ව්‍යූහයක් හා කාර්යශූර සිවිල් සේවයක් පැවති නිසා ය.

ශ්‍රී ලංකාව මෙන්ම බුරුමය ද 1948 වර්ෂයේ නිදහස ලැබූ කාලයේ නිරන්තරයෙන් සාහසික වූ බ්‍රිතාන්‍ය පාලනය ට එරෙහි ප්‍රතිරෝධය මර්දනය කිරීම පිණිස නිර්මාණය කළ ආණ්ඩු ක්‍රමයක් දායාද කරගත්තේය. නමුත් මෙකී ක්‍රමය තුළ නීතියේ ආධිපත්‍යය කල්පනා මාත්‍රයක් නොවීය. අලංකාරෝක්තියක් නොවීය. දේශභූමිය ට ස්වයං සාර්ථකත්වයක් ලබාගැනීමට එයින් හැකි කර තිබිණි. එසේම අධිකරණමය හා ව්‍යවස්ථාපිත ව්‍යුහයන්ගේ පැවැත්ම සහ මූලික අයිතිවාසිකම් සුරක්ෂණය කළ චින්තන රටාවක් හරහා එය අනාගතය සඳහා අවස්ථා සැලසුවේය.

මේ හේතුව නිසා, අලුත නිදහස ලැබූ බුරුම රාජ්‍යයේ යටත්විජිත නීතිය අවලංගු බවට පවත්නා නීතියේ නීත්‍යානුකූලභාවය බුරුම ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියාත්මක කළ වහාම එක් පුද්ගලයෙක් විසින් එය ඉදිරියේ අභියෝගය ට ලක් කළ විට අග විනිසුරු බා යූ සිය තර්කයේදී ආපස්සට පනිමින් කියා සිටින්නේ, පූර්ව නීති තන්ත්‍රයක් "බියජනක හා විනාශකාරී" ලෙස සලකා අවලංගු කිරීමෙන් වියහැකි ප්‍රතිවිපාක "රටේ ආර්ථික හා සමාජයීය ජීවිතය වියවුල් කිරීම" ට හේතු විය හැකි බව විස්තර කරමිනි. (*U Htwe v. U Tun Ohn & One*, 1948 BLR (SC) 541, 552 හි)

බැසිල් ප්‍රනාන්දු ද මේ අවුල ගැන කතා කරයි. මෙහිදී එම ව්‍යාකුලත්වය පැනනගිනුයේ ඔහුගේ ග්‍රන්ථය ට විෂය වන ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යස්ථාවෙනි. සිය ග්‍රන්ථය පුරාවටම ඔහු විසින් පෙන්වා දෙන පරිදි, නෛතික නියමයන් පවත්වාගෙන යාම හා ශක්තිමත් කිරීම ආණ්ඩු ක්‍රම ව්‍යස්ථාවෙහි අරමුණු වශයෙන් දක්වා තිබුණද, සිදුකළේ නිශ්චිත වශයෙන් ම එයට ප්‍රතිවිරුද්ධාර්ථයයි. එනම් එය එහි හරයාත්මක ආකෘතීන් අත්හැර දැමුවේය. පෙර පැවති ක්‍රමයේ සරුව පිත්තල භාවය හා ඇතැම් මෙවලම් රඳවා තබාගන්නා අතරම, එකල පැවති දේශපාලන හා නීති පද්ධති මත ප්‍රාමාණික වූ පදනමෙන් පැන නැගුණු කෝලමක් හෝ විහිළුවක් බවට පත්වූයේ එය එසේ වුවත් සිදුකළ වෙනස්කම් සිතු තරම් ශ්‍රේෂ්ඨ නොවන බව ශ්‍රී ලාංකිකයන් ට අවධාරණය කරමිනි.

ශ්‍රී ලංකාව හා බුරුමය යන රටවල් ද්විත්වය ම නිදහස් රාජ්‍යයන් වශයෙන් ස්වකීය ජීවිත ආරම්භ කළේ රාජ්‍ය ව්‍යුහයේ කොන් ගල ව්‍යවස්ථාපිත අධිකාරිය වන බවට හැඟීමක් ද සමගිනි. 1950 දශකයේදී උරුමකර දුන් ප්‍රමුඛතම නඩු තීන්දුවක් මගින් බුරුමයේ 1947 ආණ්ඩු ක්‍රමය යටත් විජිත යුගයේ සංස්ථාපනය වූ ව්‍යවස්ථාපිත සංකල්පනාව මත රැඳී ඇති ආකාරය *අග විනිසුරු උ එ මවින්ග්* විසින් සලකා බලයි.

චාරිත්‍රමය නීති, එංගලන්තයේ පොදු නීතිය සහ සාධාරණත්වයේ මූලධර්ම, සමානාත්මතාවය හා යහපත් හෘද සාක්ෂිය ඒවායේ නෛසර්ගක බලයකින් ක්‍රියාවේ යෙදවුණා නොව බලගැන්වීමෙන් ක්‍රියාවේ යෙදවුණා වේ. එය සිදුකළේ එක්සත් බුරුමයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සෑදූ සහ පැනවූ මේ ක්‍රමය යටතේ ජීවත් වූ හෝ පුහුණුව ලද ජනතාව විසිනි. තවද මේ අනුව, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව විසින් "නීතිය" පිළිබඳ කතා කරන විට එය, ව්‍යවස්ථාදායකයේ ශක්නුවත් බව ඇතුළත සිදුකළ සහ නිසි ආකෘතියකින් පැනවූ ව්‍යවස්ථාදායකයේ කැමැත්ත පිළිබඳ කතා කරන බව නිගමනය කිරීම සාධාරණ වේ. (*Tinsa Maw Naing v. The Commissioner of Police, Rangoon*, 1950BLR (SC) 17, 25 හි)

බුරුම ව්‍යවස්ථාදායකයේ කැමැත්ත පිළිබඳ මෙම සංකල්පය සහ ව්‍යවස්ථාදායක අධිකාරියේ අර්ථ නිරූපකයෙක් වශයෙන් අධිකරණයේ භූමිකාව 1962 වර්ෂයේ පටන් හීන වන්නට පටන් ගත්තේය. සිවිල් යුද්ධය හා දේශපාලන නොසන්සුන්තාවය මධ්‍යයේ ජෙනරාල් නී වින් ආණ්ඩුව බලයෙන් පැහැරගත්තේ නියත වශයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පරිච්ඡේදය අවසාන කරමිනි. කිසිදු විශේෂ වැදගත්කමකින් තොරව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය පාලනය ද පිරිහී ගියේය. 1974 වර්ෂය වන තෙක් ම නී වින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ට පිටතින් වූ හමුදා ඒකාධිපතිත්වයක් යටතේ රටේ පාලනය ගෙන ගියේය. ඉන්පසුව 1974 දී නව තනි පක්ෂ පාර්ලිමේන්තුවක

ප්‍රධානියා ලෙස සිවිල් බලහත්කාරය දක්වා වෙනස් විය. 1988 සිට 2010 දක්වා ඔහුගේ අනුප්‍රාප්තිකයන් එම පාලනය පවත්වාගෙන ගියේද ඔවුන්ගේ අධිකාරිය සඳහා කිසිදු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය පදනමකින් තොරව ය.

ශ්‍රී ලංකාවේ, පාර්ලිමේන්තු යුගය හා පශ්චාත් පාර්ලිමේන්තු යුගය අතර හෝ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවම නොවන යුගයන් අතර හෝ ඓතිහාසික භේදනයක් ඇති කළ, හිටි අඩියේ ඇති වූ හමුදාමය මැදිහත්වීමක් නොමැති වුවද ඒකාධිපතිත්වය වෙත ට රට නැඹුරු වීම ද පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ව්‍යවස්ථානුකූල බලය විතැන් වීම සහ විධායකය වෙත ක්‍රමිකව වර්ධනය වන බලධාරිත්වයක් සහිත ව්‍යවස්ථාවන්ගේ පහළවීම සමග අතිශයින් ම කුළුපග ලෙස බැඳී තිබේ.

බැසිල් ප්‍රනාන්දු විසින් සිව්වැනි පරිච්ඡේදයේදී තර්ක කරන ආකාරයට 1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම සූත්‍රය පිළිබඳ ගැඹුරු සැකයක් පළ කරයි. එමගින් සිවිල් සේවා කොමිසම ඉවත් කෙරිණි. ඒ අනුව විධායකයට, පත්වීම් සෘජුව පාලනය කළ හැකි සහ පැහැර ගත හැකි කෙටිකාලීන ව සාධාරණ විය හැකි වෙනස්කම් අදාළ ක්‍රියාපටිපාටීන් ට සිදුකළ හැකි විය. එය අධිකරණ සමාලෝචනය ද අහෝසි කළේ ප්‍රබල දේශපාලන ගැටලු පිළිබඳ නෛතික ප්‍රශ්නවලදී අධිකරණ තීරකයන් වශයෙන් ක්‍රියාකිරීම අභාවප්‍රාප්ත කරමිනි.

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව එහි පූර්වගාමියා ව අනුගමනය කළේ විධායක ජනාධිපති-ජේ ආර් ජයවර්ධන හට විනිර්මුක්තිය ලබාදෙමිනි. බලය අත්‍යාධික කර ගැනීමෙහි සිය උනන්දුව තුළ ශ්‍රී ලාංකිකයන් අද දක්වාම නොකඩවා ගිල දමමින් සිටින ව්‍යවස්ථානුකූල දැවැන්ත අපරරූපියෙක් හෙවත් භයංකාර සතෙක් ජයවර්ධන නිර්මාණය කළේය.

පළමු පරිච්ඡේදයේදී ප්‍රශ්නයේ තීරණාත්මක ගැටලුව වෙත ගමන් කරනා ප්‍රනාන්දු මෙසේ අසයි. "(1978) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කෙරෙනා බවට ඇපකරුවන් වන්නේ කවුද?" ඔහු තවදුරටත් මෙසේ කියයි.

ජනාධිපතිවරයාගේ හදිසි කල්පනාවක් මත විසුරුවා හැරිය හැකි හෙයින් එය පාර්ලිමේන්තුව විය නොහැක. ඕනෑම අවස්ථාවකදී කිසිවක් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් පාර්ලිමේන්තුව ට තනිව නැත. විධායක බලය ජනාධිපති වෙත රැඳෙයි.

එසේ හෙයින්, භාරකරු වන්නේ විධායක ජනාධිපති ය.

බුරුමය හා ශ්‍රී ලංකාව අද දිනයේ බැඳ තබන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය බන්ධනය වන්නේ මෙයයි. දෙරටේ ඒකාධිපති අභිසාරිතාවය නොකඩවා ක්‍රියාත්මක කරන බන්ධනය වන්නේ එයයි. 2008 වර්ෂයේ සිට බුරුම

පළමු පරිච්ඡේදයේදී ප්‍රශ්නයේ තීරණාත්මක ගැටලුව වෙත ගමන් කරනා ප්‍රනාන්දු මෙසේ අසයි. "(1978) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කෙරෙනා බවට ඇපකරුවන් වන්නේ කවුද?" ඔහු තවදුරටත් මෙසේ කියයි.

ජනාධිපතිවරයාගේ හදිසි කල්පනාවක් මත විසුරුවා හැරිය හැකි හෙයින් එය පාර්ලිමේන්තුව විය නොහැක.

ඕනෑම අවස්ථාවකදී කිසිවක් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් පාර්ලිමේන්තුව ට තනිව නැත. විධායක බලය ජනාධිපති වෙත රැඳෙයි.

එසේ හෙයින්, භාරකරු වන්නේ විධායක ජනාධිපති ය.

බුරුමය හා ශ්‍රී ලංකාව අද දිනයේ බැඳ තබන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය බන්ධනය වන්නේ මෙයයි. දෙරටේ ඒකාධිපති අභිසාරිතාවය නොකඩවා ක්‍රියාත්මක කරන බන්ධනය වන්නේ එයයි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ද මෙපරිද්දෙන් ම සිය විධායක ජනාධිපති ධුරය සංස්ථාපනය කරගෙන තිබේ. එය සැදී තිබෙනුයේ අධිකරණය ට හෝ ව්‍යවස්ථාදායකයට නොව ජනාධිපතිවරයා හට භාරකාරත්ව භූමිකාව ලබාදීමට ය.

ව්‍යවස්ථානුකූල භාරකාරත්වය විධායක ජනාධිපතිවරයෙකු ට ප්‍රදානය කිරීමේ ආදීනව පිළිබඳ නොසිතන පුද්ගලයන් හට 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ මෙකී අසමත්කම පෙනී යනු ඇත්තේ යම්කිසි උනන්දු සහගත නවීකරණයකට වඩා මදක් වැඩි යමක් ලෙස මිස, අප අවශ්‍යයෙන්ම පමණ ඉක්මවා සැලකිලිමත් විය යුතු යමක් ලෙස නොවේ. ඇත්ත වශයෙන් කියතොත්, මේ ආකාරයේ ව්‍යවස්ථානුකූල භාරකාරත්වයක් සහ ව්‍යවස්ථාපිත අධිකාරියක් යටතේ තිබෙන භාරකාරත්වයක් අතර ඇති වෙනස, ප්‍රජාතාන්ත්‍රික රජයක් සහ නරකම ඒකාධිපතිත්වය අතර ඇති වෙනසට වඩා අඩු යමක් නොවේ. ජුර්ගාන් හබේමස් විසින් ලියා ඇති පරිදි,

> *අද දිනයේ ජර්මානු ජනාධිපතිවරයා සම්බන්ධයෙන් කාල් ෂ්මිට් හට සිදුකිරීමට අවශ්‍ය වූ පරිදි-ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය අධිකරණයක් වෙනුවට විධායක ශාඛාවේ ප්‍රධානියා පත්කිරීම ට අවශ්‍ය ඕනෑම කෙනෙක්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය රාජ්‍යයක බලය බෙදීමේ අර්ථය එහි සකල විරුද්ධාර්ථය සමග අඹරවා පටලවා ගනියි.*
>
> - (*Between Facts & Norms*, පිටු 242-243)

මෙය ඉතාම නිවැරදි ව බැසිල් ප්‍රනාන්දු ගේ අධ්‍යයනයේ කේන්ද්‍රයෙහි පවත්නා ප්‍රශ්නයයි. මන්ද යත් ඔහු විස්තර කරන පරිදි ශ්‍රී ලංකාවේ 1978 වර්ෂයේ පටන් සංස්ථාපනය වී තිබෙනුයේ මේ ආකාරයේ "ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය" රාජ්‍යයක් ම වන නිසා ය.

**මෙකී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාපිත සැකසුම යටතේ ඒකාධිපතිත්වය එහි අතුරු ආබාධයක් නොවේ. එය ආණ්ඩු ක්‍රමයේ ව්‍යුහය තුළට ම ඔබ්බවා ඇත්තකි. එය වළක්වාගත නොහැකි ය.**

**එසේ හෙයින්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ට සිදුකරන 18 වැනි සංශෝධනය සමග ප්‍රජාතන්ත්‍රවාදයේ මායාවෙන් සකල ඒකාධිපතිත්වය ට මාරුවීම පිළිබඳ අවසානාත්මක අනතුරු ඇඟවීම අතිශයෝක්තියක් හෝ තත්වය එක දෙක කර දැක්වීමක් නොවේ.**

බලය බෙදීමේ අර්ථය පටලවාගත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ මේ මොඩලය සතුව අධිකතර ඒකාධිපති ලක්ෂණ තිබේ. මෙකී ලක්ෂණයන් හුදෙක් භාවිතයේ ගැටලුවක් නොවේ. ඒවා ආකෘතිය වෙත ආවේණික ය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූල භාරකාරත්වය විධායක නිලධාරියෙකු වෙත ලබාදෙන හෙයින්, හබේමස් විසින් ව්‍යංගයෙන් කියූ ජර්මනියේ වෙයිමාර් රෙජීමය යටතේ ෂ්මිට් විසින් විජයග්‍රාහී කළ පරම, පහසු ආඥාදායකත්වයේ ප්‍රාමාණික සංකල්පය වෙත එම නිලධාරියා නැඹුරු වෙයි.

ආණ්ඩුක්‍රමය විසින් ම විධායක ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ට පිටතින් ස්ථානගත කිරීම තුළින් ඔහුට තනිව එහි භාෂිතයන් උල්ලංඝනය කළ හැකිය. ප්‍රනාන්දු විසින් පස්වැනි පරිච්ඡේදයේදී 1978 ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණයක් වශයෙන් විස්තර කරන මෙය, නිසැක ලෙස ම ෂ්මිට් විසින් භුක්ති විඳි දෙයයි. එය එසේ වනුයේ භාරකරු ආණ්ඩු ක්‍රමය ට බැඳ තැබිය නොහැකි වන නමුත් ඔහු හැම විටෙක ම එය ඉක්මවා යමින් එයට ඔබ්බෙන් සිටිය යුතු වන නිසා ය.

මෙකී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාපිත සැකසුම යටතේ ඒකාධිපතිත්වය එහි අතුරු ආබාධයක් නොවේ. එය ආණ්ඩු ක්‍රමයේ ව්‍යුහය තුළට ම ඔබ්බවා ඇත්තකි. එය වළක්වාගත නොහැකි ය. එසේ හෙයින්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ට සිදුකරන 18 වැනි සංශෝධනය සමග ප්‍රජාතන්ත්‍රවාදයේ

මායාවෙන් සකල ඒකාධිපතිත්වය ට මාරුවීම පිළිබඳ අවසානාත්මක අනතුරු ඇඟවීම අතිශයෝක්තියක් හෝ තත්වය එක දෙක කර දැක්වීමක් නොවේ.

බුරුමය මෙන් නොව ශ්‍රී ලංකාවේ සියල්ල එකට බැඳ තබාගන්නා කේන්ද්‍රීය ආයතනයක් නොමැත. නායකත්වයේ භූමිකාව රඟපෑම ට ශක්නුවත් වන්නේ විධායකය පමණක් බව අවධාරණය කරමින්, කලක් එකී භූමිකාවන් ඉසිලූ සෙසු සියලු ආයතනයන් සුණුවිසුණු කිරීමෙහි යෙදී සිටියි.

පෙනෙන පරිදි, ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය ගොඩ නැංවී තිබෙනුයේ, ලොක්කා හෝ ප්‍රධානියා වනුයේ අත්‍යවශ්‍යයෙන් ම විධායක ජනාධිපති ය යන සරල අවධාරණය මත ය.



නමුත්, ව්‍යවස්ථානුකූල සැකසුම් තිබූ පමණින් යහපත් ආයතන බිහිවීම ට තරම් ඒවා සද්ගුණවත් නොවේ. මෙහිදී ලංකාවේ සන්දර්භය ට පටහැණි තත්වයක් ද නිරූපණය වේ.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ද බුරුමයේ ද ඒකාධිපතීන්ගේ අරමුණ සේ පෙනෙන්නේ රාජ්‍ය අඩුවැඩියේ සෙසු කොටස්වල ගාස්තුව ට යටත්ව විධායකයේ ශ්‍රේෂ්ඨත්වය සංස්ථාපනය කිරීමයි. මෑත භාගයේදී මෙකී ශ්‍රේෂ්ඨත්වය සංස්ථාපනය වූයේ ආයතනික සැලසුම හරහා ය. රටේ හමුදාවේ සාර්ථකත්වය වූයේ කාර්යක්ෂම ව ක්‍රියාත්මක වීම සඳහා සරල වශයෙන් සෙසු සියලු ආයතනවල පරාසයන් පරාජය කිරීම නොවේ. එහි පරාසය තුළ එය විසින් ම, අසහාය ලෙස ක්‍රියාකාරී වන රාජ්‍ය ආයතනය බවට පත් වීමයි. කෙටියෙන් පවසන්නේ නම්, බුරුමයේ අද දිනයේ පවතින රෙජීමය, රටේ පවත්නා අතිශය ජරාජීර්ණ වූ තත්වය හා මිලියන ගණන් ජනතාව ට යැපෙන්නට බල කළ පත්ලක් නොපෙනෙන වාතාවරණය වැලි මත ඉදි කළ එකක් නොවේ. එහි විධායක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල භාරකාරත්වය සන්නද්ධ හමුදාවන්ගේ අසමසම දේශපාලනික හා භෞතිකමය අධිකාරිය තුළට මුල් බැස ගෙන තිබේ.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රනාන්දු පෙන්වා දෙන දෙය නම්, අනෙක් අතට, විධායකය ඔසවා තබනු පිණිස කොතෙකුත් දෑ පහතට ඇද දමා ඇති නමුත්, ගොඩනංවා ඇත්තේ ඉතා ම සුළු දෙයක් පමණක් වන බවයි. බුරුමය මෙන් නොව ශ්‍රී ලංකාවේ සියල්ල එකට බැඳ තබාගන්නා කේන්ද්‍රීය ආයතනයක් නොමැත. නායකත්වයේ භූමිකාව රඟපෑම ට ශක්නුවත් වන්නේ විධායකය පමණක් බව අවධාරණය කරමින්, කලක් එකී භූමිකාවන් ඉසිලූ සෙසු සියලු ආයතනයන් සුණුවිසුණු කිරීමෙහි යෙදී සිටියි. පෙනෙන පරිදි, ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය ගොඩ නැංවී තිබෙනුයේ, ලොක්කා හෝ ප්‍රධානියා වනුයේ අත්‍යවශ්‍යයෙන් ම විධායක ජනාධිපති ය යන සරල අවධාරණය මත ය. මෙකී බලපුළුවන්කාරකම වලංගු කරන කිසිදු ස්ථාවර ආයතනික

පදනමක් නොපවතින්නේ වුවද, එය බරපතළ ලෙස අභියෝගයට ලක්වන අවස්ථාවකදී අසම්භාව්‍ය ලෙස පෙනී යන්නේ එයට පැවැත්මක් ඇති බවය.


ශ්‍රී ලංකාව අරෝවන් රාශියක් සහිත එනමුත් විවාදයන් රහිත භූමියක් බවට පත් වී තිබේ. රණ්ඩු දබර නිතරම ප්‍රචණ්ඩ අතට හැරේ. ඉඳහිට ඝාතන බවට හෝ ඊටත් වඩා දරුණු තත්වයන් බවට පත්වේ. එසේම ප්‍රචණ්ඩත්වය ද අලුත් දබර වලට මග පාදයි. එම චක්‍රය නැවත නැවතත් සිදුවෙයි. දුක්මුසු ලෙස, කිසිවක් ම විවාදයක් බවට පත් නොවෙයි. විවාදය නෂ්ට වූ කලාවක් බවට පත්ව ඇත. එය කුමක්දැයි කිසිවෙකුගේ මතකයේ පවා රැඳී නැති බව පෙනෙයි.

ඇතැම් කරුණු සම්බන්ධයෙන් මේ තත්වය, ඉතා ගිජු නමුත් විශ්වාසනීය සහ සුරක්ෂිත හමුදා නායකත්වයක් සහිත බුරුමයේ පැනනගින අන්තරායකර තත්වය ට ද වඩා භයානක හා වඩාත් අස්ථිර තත්වයක් ශ්‍රී ලංකාව සඳහා නිර්මාණය කරයි. නමුත් මෙසේ පැතිර පවත්නා තත්වය වෙහෙස නොතකා විවේචනාත්මක ව විග්‍රහ කිරීම තුළින් වඩාත් අරුත්බර වෙනසක් සඳහා එය ජනතාව ට වැඩි වශයෙන් අවස්ථා සපයන්නේ ද වෙයි.

පැහැදිලිව ම, 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ ඒ හා සබැඳී ඇති ඒකාධිපති බූදලයත් පිළිබඳ සැබෑ විවාදයක් උත්පාදනය කිරීම බැසිල් ප්‍රනාන්දු ගේ මේ පොත ලිවීමෙහි ප්‍රධාන අරමුණු අතරින් එකක් වෙයි. තවද ලේඛනයෙහි අග හරියට වන්නට ඔහු විසින් පැහැදිලි ව දක්වන පරිදි විවාදය යන්න රණ්ඩුවෙන් හෝ අරෝවෙන් සහමුලින් ම වෙනස් ය.

ශ්‍රී ලංකාව අරෝවන් රාශියක් සහිත එනමුත් විවාදයන් රහිත භූමියක් බවට පත් වී තිබේ. රණ්ඩු දබර නිතරම ප්‍රචණ්ඩ අතට හැරේ. ඉඳහිට ඝාතන බවට හෝ ඊටත් වඩා දරුණු තත්වයන් බවට පත්වේ. එසේම ප්‍රචණ්ඩත්වය ද අලුත් දබර වලට මග පාදයි. එම චක්‍රය නැවත නැවතත් සිදුවෙයි. දුක්මුසු ලෙස, කිසිවක් ම විවාදයක් බවට පත් නොවෙයි. විවාදය නෂ්ට වූ කලාවක් බවට පත්ව ඇත. එය කුමක්දැයි කිසිවෙකුගේ මතකයේ පවා රැඳී නැති බව පෙනෙයි.

ශ්‍රී ලංකාවේ කිසිවෙකු හට විවාදය යනු කුමක්දැයි මතකයේ රැඳී තිබුණද-නැතද නියත වශයෙන් ම එය ප්‍රනාන්දු ගේ මතකයේ රැඳී තිබේ. *ගයිජස් ගේ මුද්ද* පුරා ම ඔහු විසින් පෙන්වා දෙන පරිදි ආණ්ඩුක්‍රමය සහ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමෙහිලා විධායක ජනාධිපතිගේ භූමිකාව පිළිබඳ විවාදය අවසානයේ ලැබෙන්නට යන දෙයයි. මේ පොත කියවා එම අභියෝගය බරපතළ ලෙස භාරගැනීම ඔහුගේ සමදේශිකයන් හට භාර ය.





# පරමාධිපත්‍යයක් නැති ජනතාවක්

- ආසියානු මානව හිමිකම් කොමිසම විසිනි

*කාන්තාවකට තනි පංගලමේ රටේ එක් කොණක සිට අනෙක් කොණට ආරක්ෂිතව යා හැකි ඉතිහාසයක් තිබූ බවට ඉතිහාස කතා අපේ රටේ බොහොමයකි. නමුත් අද තත්වය කොතරම් වෙනස්ද? අගනුවරට නුදුරේ මහ දවාලේ වුවත් ස්ත්‍රී දූෂණ සිදුවෙයි. ඒ පිළිබඳ වගකිවයුත්තන් නිහඬ අතර ඒ පිළිබඳ සමාජ කථිකාවතක් ගොඩනැංවෙනුයේ ද ඉතා දුබල සහ දුලබ ලෙස ය. ශ්‍රී ලංකා සමාජය දැන් ප්‍රවණතාවක් ලෙසින් හුරු වී සිටින්නේ නෑසූ කනින් නොදුටු දෑසින් සිටින්නට ය. රටේ යහපාලනයක් තිබේ නම්, නීතියේ ආධිපත්‍යයක් ක්‍රියාත්මක වේ නම් මෙවැනි සිදුවීම් මෙතරම් සුලබ වන්නේ නැත. අපරාධකරුවන් සුරක්ෂිත වන රටක අපරාධකරුවන් බුරුතු පිටින් බිහිවීමේ ප්‍රවණතාවක් ඇති වන්නේ අපරාධයට දඬුවම් නොලැබෙන බව ඇස් පනා පිටි පෙනී යන නිසා ය. දඬුවමට ඇති බිය නැති වන විට අපරාධ අධික වෙයි. පහත දැක්වෙන්නේ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් නුගේගොඩ පින් ළිඳ අසල සිදුවූ සමූහ ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන්* **"ශ්‍රී ලංකාව: කොළඹ ට ආසන්නව සිදුවූ සමූහ ස්ත්‍රී දූෂණය, ජනතා පරමාධිපත්‍යය සහ විරෝධතා නොමැති කම'** *යන මාතෘකාව යටතේ නිකුත් කළ ප්‍රකාශයයි.*

නුගේගොඩ, විජේරාම ප්‍රදේශයේදී වයස අවුරුදු 45 ක කාන්තාවක් (ඇතැම් වාර්තාවලට අනුව ඇගේ වයස අවුරුදු 47 කි) ජනවාරි 23 වැනිදා පෙරවරුවේ සමූහ ස්ත්‍රී දූෂණයට ලක්වූවාය. මේ බිහිසුණු සිදුවීම විසින් ඇතැම් පුවත්පත් සහ මාධ්‍යයන් හි ලබාගත්තේ පේළි කිහිපයක් පමණි. මේ හා සමාන සිද්ධියක් ඉන්දියාවේ නවදිල්ලි නුවර සිදුවූ විට, එනම් වෛද්‍ය ශිෂ්‍යාවක් බස් රථයකදී සමූහ ස්ත්‍රී දූෂණයට ලක් වූ විට එයින් කුපිත වූ ඉන්දියානුවන් දින ගණන් රට පුරාම උද්ඝෝෂණ පැවැත්වූ අතර ඇත්තවශයෙන්ම එම උද්ඝෝෂණ අද දක්වා ද අන්තර්ජාතික මට්ටමින් පැවැත්වේ. මෙම විරෝධතාව නිසා අග්‍රාමාත්‍යවරයා ට ප්‍රශ්නයට මැදිහත්වීම ට සිදුවූ අතර, එහිදී එම තරුණියට වෛද්‍ය ප්‍රතිකාර සහ යුක්තිය ඉටු කරවා දීමට පමණක් නොව මේ හා සමාන සිද්ධි නැවත සිදුනොවීම සඳහා වේගවත් නීති සම්පාදනයක් සඳහා පියවර ගැනීම ටද ඔහුට සිදුවිය. මෙවැනි සිදුවීමක් නේපාලයේ මහජන අවධානය දිනාගත් විට ද විරෝධතා හට ගත්තේය. මෙහිදී, නීති සම්පාදනයන් සිදුකිරීම ට පමණක් නොව ස්ත්‍රීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සෙසු ප්‍රතිසංස්කරණ සිදුකරන ලෙස ද රජයෙන් ප්‍රබල ලෙස ඉල්ලා සිටිනු ලැබීය.

මාධ්‍ය සහ ජනතාවගේ හා කාන්තා ව්‍යාපාරවල (ප්‍රාදේශීය දේශපාලනඥයන් ද ඇතුළු) සක්‍රිය සහභාගිත්වය හේතුවෙන් ඉන්දියාව සහ නේපාලය යන රටවල් දෙකේදී ආරක්ෂාව සහතික කරන ලෙස ඉල්ලමින් සහ මහජනතාව ආරක්ෂා කිරීමට රාජකාරියෙන් බැඳී සිටින නීති සාධන ආයතනවල මන්ද ක්‍රියාකාරිත්වය සඳහා සිය කෝපය ප්‍රදර්ශනය කරමින් ජනතාවගේ සක්‍රිය සහභාගිත්වය විදහා දැක්වුණි.

රටවල් දෙකෙහිදී ම මෙම උද්ඝෝෂණවලට මාධ්‍ය ප්‍රතිචාර දැක්වූ අතර, අවාසනාවන්ත සිද්ධියක් සිදුවූ අවස්ථාවක් මුළු ජාතියේම අන්තරාවලෝකනය සිදුකරන අවස්ථාවක් වන බවට සාක්ෂාත් කර ගැනීමට වෙහෙස වූහ. තවද නීති සාධන ආයතනවල අර්බුදය හා අනාගතයේ මෙවන් අවස්ථාවල ආණ්ඩු, අවශ්‍ය කරන උද්‍යෝගයෙන් යුතු ව ක්‍රියා කරන බවට සහතික කිරීම පිළිබඳ සාකච්ඡා කළහ. අනෙක් අතට, මහජනයාගේ හෘද සාක්ෂියේ ගැටලු පිළිබඳ මාධ්‍යයන්ගේ භූමිකාව විසින් සාකච්ඡා කෙරිණි. අනෙක් අතට, සිය සංවේගය මෙන්ම එබඳු අපරාධ සිදුවීම හැකි කරවූ ආණ්ඩුවේ දෝෂයන් පිළිබඳ ව විවේචනාත්මක ව සාකච්ඡා කළහ.

ශ්‍රී ලාංකේය මාධ්‍යන්ගේ දැකිය හැකි වූ කෙටි වාර්තාවලට අනුව, සමූහ ස්ත්‍රී දූෂණයේ වින්දිතයා බවට පත්වූ කාන්තාව වෙළඳසැලකට ගිය බවත් මග වැරදීම නිසා ත්‍රීරෝද රථ රියැදුරෙකුගෙන් ඒ පිළිබඳ ඇසූ බවත් සඳහන් වේ. ඇයට උපකාර කරන බවට ව්‍යාජ ලෙස හඟවමින් එම ත්‍රීරෝද රථ රියැදුරා ඇයගේ කැමත්තට එරෙහිව ඇයව ත්‍රීරෝද රියට ගොඩ නංවා ගෙන ඇති අතර ළිඳක් අසල ට ගෙනගොස් තර්ජනය කර තිබේ. ඉන්පසු තවත් ත්‍රීරෝද රියකින් පැමිණි පුද්ගලයන් කිහිප දෙනෙක් විසින් ඇය ව සමූහ ස්ත්‍රී දූෂනයට ලක් කර ඇත. ඇය කළුබෝවිල රෝහලට ප්‍රතිකාර සඳහා ගෙන ගිය බව පැවසේ. ත්‍රීරෝද රථයෙන් පැමිණි අයගෙන් සොයාගත් දේ අතර කොන්ඩම් ද තිබී ඇති අතර, ප්‍රහාරකයන් නිතරම මෙවැනි ක්‍රියාවන් හි නියැළෙන්නන් වියහැකි බව ට නිරීක්ෂකයෝ යෝජනා කරති.

## ජනතා පරමාධිපත්‍යය යටතේ අපචාරයන් කළමනාකරණයට නව ප්‍රවේශයක්

මෑත කාලයේදී මෙවැනි අපචාරයන් සිදුවූ විට පොලිසිය විසින් වාර්තා ගොනු කරන අතර අත්අඩංගුවට ගැනීම්ද සිදුකරන අතර මෙයින්, නීතිය ක්‍රියාත්මක වන බවට හැඟීමක් මහජනයා අතර නිර්මාණය වීම නිසා මහජනතාව සතුටට පත්වෙති. කෙසේ නමුත්, අත්අඩංගුවට ගැනීම් සිදුකර මද කාලයකින් මේ ප්‍රශ්න අමතක වී යයි. හැම ආකාරයකම ප්‍රමන්ත්‍රණ සහ අල්ලස් හුවමාරු මගින් හෝ දේශපාලනඥයන්ගේ මැදිහත්වීම් මගින් යුක්තියේ නිසි ක්‍රියාදාමය මං මුළා කරවනු ලැබේ. පුද්ගලයන් කිහිප දෙනෙක් ඝාතනයට ලක්වූ අවස්ථාවන් වලදී, ආණ්ඩුවේ ම දේශපාලනඥයකු වූ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර සහ කැලණියේ ඡන්දයෙන් තේරී පත්වූ ප්‍රාදේශීය සභා නිලධාරියෙකුගේ ඉතා මෑතකදී සිදුවූ ඝාතනය මේ ස්වභාවය ප්‍රසිද්ධියේ ම ප්‍රදර්ශනය වූ අවස්ථාවන් ය.

තංගල්ලේදී සිදුවූ, තංගල්ල නගරසභා සභාපති සහ සෙසු අය විසින් කළ බව ට චෝදනා එල්ල වූ බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඝාතනය සහ ඔහුගේ රුසියානු සහකාරිය දූෂණයට හා අඩන්තේට්ටම්වලට ලක්කිරීමේ සිදුවීම ද මේ ආකායට ම යටපත් කරන ලදී. දකුණේ තවත් ප්‍රදේශකයකදී ප්‍රාදේශීය දේශපාලකයන් කිහිපදෙනෙක් විසින් දැරියක දූෂණයට ලක් කිරීම ද අවසන් වූයේ මේ ආකාරයටම ය. මේ හා සමානව, ආණ්ඩුවේ පාර්ලිමේන්තු සාමාජික දුමින්ද සිල්වා ට එල්ල වූ ස්ත්‍රී දූෂණ චෝදනා වලින් ද කිසිවක් ම සිදුවූයේ නැත. ඇත්ත වශයෙන්ම, සැබෑ විපාකයක් නොමැතිව අවසන් වූ අපරාධවල ලැයිස්තුව ඉතා දිගු ය.

ඉදිරි දිනයකදී මේ සිදුවීමේ ස්ත්‍රී දූෂණයට ලක්වූ වින්දිත කාන්තාවට සහ ඇගේ පවුලේ අයට අරලියගහ මන්දිරයට පැමිණෙන ලෙස කියා ජනාධිපති අරමුදලෙන් මුදල් ස්වල්පයක් ලබාදුනහොත් එය ද පුදුමයක් නොවේ. ඊනියා අනුකම්පාව යැයි කියන මේ ආකාරයේ උදාහරණ, මෙවැනි අපචාරයන් සිදුවූ අවස්ථා රාශියකදීම දක්න ට ලැබිණි. රිසානා නෆීක් ගේ සිද්ධිය නොතකා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇය සෞදි අරාබියේදී හිස ගසා දැමීමෙන් පසුව ඇගේ මව ව ජනාධිපති මන්දිරයට කැඳවා ඇයට මුදල් ස්වල්පයක් දී තිබේ.

> **මෙහි ප්‍රතිඵලය වන්නේ නැවත නැවතත් සිදුවන අපරාධ සහ නීතිය ක්‍රියාත්මක වන බවට මතයක් නිර්මාණය කිරීම සඳහා, ජනතාවට ආරක්ෂාව සහතික කිරීමට ගන්නා සැබෑ උත්සාහයන්ගෙන් තොරව දේශපාලනඥයන් විසින් සිදුකරන ප්‍රයෝග වේ.**

## නීතියක් නැති කම සහ මහජනයාගේ උදාසීනකම

ශ්‍රී ලංකාවේ, පුළුල් ලෙස පැතිරුණු නීතියක් නැති කම, විශේෂයෙන්ම කාන්තාවන් ට එරෙහි ව කම්පා කරවනසුලු වැරදි විශාල වශයෙන් සිදුවන බවට ප්‍රසිද්ධියේ පිළිගැනෙන අතර මෙවැනි සිද්ධිවලට මහජනයා ප්‍රතිචාර දක්වන්නේ උදාසීන ලෙස ය. යුක්තිය ජවසම්පන්න ලෙස ලුහුබැඳයන ලෙස හෝ එයට වගවන ලෙස ආණ්ඩුවෙන් ප්‍රබල ලෙස ඉල්ලා සිටීමක් නැත.

ඉතා දරුණු අපරාධ සම්බන්ධයෙන් මෙන්ම නීති සාධන ආයතනයන්හි ගැටලු විසඳීම වෙත ආණ්ඩුවේ පාර්ශවයෙන් දක්වන සාපරාධී නොසැලකිල්ල ද සම්බන්ධයෙන් මහජනයා අතර පැතිර පවත්නා මෙම උදාසීන බවෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකා සමාජය සහ ශ්‍රී ලංකා අපරාධ යුක්තික ක්‍රමය දරුණු වශයෙන් රෝගාතුර වී ඇති බවයි.

පොලිස් ක්‍රමය බිඳවැටී ඇති බව පිළිගෙන තිබේ. මෙය, රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිපාදන අකර්මණ්‍ය කිරීමට හේතු වූ-විධායක ජනාධිපතිවරයා විසින් රාජ්‍යය මුළුමනින්ම පාලනය කිරීමේ සහ පිළිවෙළින් දේශපාලනීකරණය වීමේ සෘජු ප්‍රතිඵලය වේ. ස්වභාවිකව, සියලු අපරාධ පිළිබඳ විසමින් ඒ සියල්ල සමග කටයුතු කිරීමට ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ට හැකියාවක් නැත. අපරාධ පාලනය කළ හැක්කේ නීතියේ රාමුව තුළ කටයුතු කරන නීති සාධන ආයතනවල ක්‍රියාකාරීත්වය තුළින් පමණි. ජනාධිපතිවරයාගේ සහ ආණ්ඩුවේ රාජකාරිය වන්නේ මෙකී ආයතන නිසි ලෙස ක්‍රියාත්මක වන බවට සහ මහජනතාවට අත්‍යවශ්‍ය සේවා ලබාදෙන බව සාක්ෂාත් කිරීමයි. කෙසේ නමුත්, වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ක්‍රමයේ ස්වභාවය වන්නේ, නීති සාධනය හරහා මෙන්ම පාලනය සිදුකෙරෙන සෙසු අංගයන් හරහා පාලනයට බලපෑම් කරවිය හැකි විශ්වාසනීය ප්‍රතිපාදන ජනාධිපතිවරයා සහ ආණ්ඩුව වෙත නොමැති වීමයි.

මෙහි ප්‍රතිඵලය වන්නේ නැවත නැවතත් සිදුවන අපරාධ සහ නීතිය ක්‍රියාත්මක වන බවට මතයක් නිර්මාණය කිරීම සඳහා, ජනතාවට ආරක්ෂාව සහතික කිරීමට ගන්නා සැබෑ උත්සාහයන්ගෙන් තොරව දේශපාලනඥයන් විසින් සිදුකරන ප්‍රයෝග වේ. මෙම කාන්තාව සමූහ ස්ත්‍රී දූෂණයට ලක් කිරීම වැනි බිහිසුණු අපරාධවලදී ද

සමස්තයක් වශයෙන් උදාසීන ස්වභාවයකින් පසුවන සමාජයක් නිර්මාණය කිරීම මේ තත්වය විසින් ප්‍රතිඵල කර තිබේ.

ස්වාධීන මාධ්‍යයන් මර්දනයට ලක් කර ඇති හෙයින්, උදාසීනත්වය, පුළුල් ලෙස පැතිරුණු නරුමවාදය සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට ඉඩ දී තිබෙන එකම මාධ්‍ය වශයෙන් රාජ්‍ය මාධ්‍යයන්ගේ ලජ්ජා විරහිත ප්‍රවෘත්ති මෙහෙයවීම සිදුවේ.

සිය ආණ්ඩුවලට වඩාත් හොඳින් ක්‍රියාකරන ලෙස සහ කාන්තාවන් වැනි පහසුවෙන් උපද්‍රවයන්ට ලක්වීමේ අවදානම සහිත කණ්ඩායම් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින් සියලු පුරවැසියන් ආරක්ෂා කරන කාර්යක්ෂම නීති සාදන ආයතන නිර්මාණය කර දෙන ලෙස දකුණු ආසියාවේ සෙසු රටවල් ඉල්ලා සිටින විට ශ්‍රී ලංකාවේ අපරාධ, විපාක ලැබීමකින් තොරව තවදුටත් සිදුවෙමින් පවතියි.

# යුද්ධයේ ලේ වැකුණු උරුමය



## AUTHORITY WITHOUT ACCOUNTABILITY:

### The Crisis of Impunity in Sri Lanka

*ලෝකයේ සෑම කලාපයක්ම නියෝජනය කරන කීර්තිමත් සහ විශාරද විනිශ්චයකාරවරුන් සහ නීතිඥවරුන් 60 දෙනෙකුගෙන් සමන්විත ICJ හෙවත් International Commision of Jurists (අන්තර්ජාතික නීති විශාරදයන්ගේ කොමිසම), සිය සුවිශේෂී නෛතික ප්‍රවීණතාවය මගින් ජාතික සහ අන්තර්ජාතික යුක්තික පද්ධතීන් ශක්තිමත් කිරීම හරහා නීතියේ ආධිපත්‍යය තුළින් මානව හිමිකම් සුරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම සිදුකරයි. 1952 වර්ෂයේ පිහිටුවනු ලැබූ අන්තර්ජාතික නීති විශාරදයන්ගේ කොමිසම, අන්තර්ජාතික මානව හිමිකම් සහ අන්තර්ජාතික මානුෂීය නීතිය ප්‍රගතිගාමී ලෙස සංවර්ධනය කිරීම සහ බලාත්මක ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම; සිවිල්, සංස්කෘතික, ආර්ථික, දේශපාලනික සහ සමාජයීය අයිතීන් සාක්ෂාත් කරගන්නා බවට සහතික වීම; බලය බෙදාහැරීම සුරක්ෂණය; සහ අධිකරණයේත් නෛතික වෘත්තියේත් ස්වාධීනත්වය සහතික කිරීම අරමුණු කර ගෙන ක්‍රියාත්මක වේ. පහත දැක්වෙන්නේ අන්තර්ජාතික නීති විශාරදයන්ගේ කොමිසම විසින් ලංකාවේ විනිර්මුක්තියේ අර්බුදය සම්බන්ධයෙන් පළ කළ මෑතකාලීන වාර්තාවෙන් ගත් උපුටනයකි.*

2009 වර්ෂයේදී ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ලබාගත් ලේ වැකුණු ජයග්‍රහණයෙන් පසු ශ්‍රී ලංකා ආණ්ඩුව රටේ මානව හිමිකම්වල තත්වය ඉහළ නංවා ගැනීම සඳහා ලැබුණු සුවිශේෂී අවස්ථාවක් නාස්ති කර ගත්තේය. ශ්‍රී ලංකාවේ උතුරේ සහ නැගෙනහිර කුඩා ස්වයංපාලන රාජ්‍යයක් ඉල්ලා සිටිමින් විසින් වසර ගණනාවක් මුළුල්ලේ සටන්වැදුණු එල්ටීටීඊ යට, මානව හිමිකම් නීතිය මෙන්ම අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ද භයංකාර වාර්තාවක් තිබුණේය. ද්‍රවිඩ කොටින් සිය නීතිය බලගැන්වූයේ සිවිල් වැසියන් ඉලක්ක කිරීම ඇතුළු නීතිවිරෝධී ඝාතන, පැහැර ගැනීම්, ළමා සොල්දාදුවන් බලයෙන් බඳවා ගැනීම සහ බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම හරහා ය. ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ පාලනය යටතේ පැවති ප්‍රදේශවල නීතියේ ආධිපත්‍යයට සහ නීතියේ නිසි ක්‍රියාදාමයට එල්ටීටීඊ ය විසින් සුවිශේෂී හානියක් සිදුකළ බව පැවසීම ද අනවශ්‍ය ය.

සිය පුරවැසියන්ගේ ආරක්ෂාව සුරක්ෂණය කිරීම සඳහා රාජ්‍යයක් සතු යුතුකම සහ අයිතිය අන්තර්ජාතික නීති විශාරදයන්ගේ කොමිසම (ICJ) විසින් පිළිගනියි. *ත්‍රස්තවාදය සමග සටන් කිරීමේදී මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය රැකගැනීම පිළිබඳ ඍක්ෂ බර්ලින් ප්‍රකාශනය* (*Berlin Declaration on Upholding Human Rights and the Rule of Law in Combating Terrorism*) මගින්, පුද්ගලයන් ව ඔවුන්ගේ අධිකරණ බලය තුළ ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු පියවර ගැනීම ට රාජ්‍යයන් ට යුතුකමක් පවතින අතර, සෑම කල්හි ම එබඳු පියවර විසින් මානව හිමිකම් නීතිය ට සහ අන්තර්ජාතික මානුෂීය නීතිය ට ගරු කළ යුතු වන බව අවධාරණය කරයි. පුද්ගලයන්ගේ ආරක්ෂාව සාක්ෂාත් කිරීම සහ මානව හිමිකම් සුරක්ෂණය කිරීම සම්බන්ධයෙන් වන රාජ්‍යයන්ගේ යුතුකම් අතර ගැටුමක් නැත. සිය දේශභූමිය තුළ සිටින පුද්ගලයන්ගේ ආරක්ෂාව සුරැකීම මගින් නිසැක වශයෙන්ම ඕනෑම රාජ්‍යයක් වෙත මානව හිමිකම් සංස්ථාපනය කිරීම සඳහා බැඳීමක් ඇති වෙයි. ශ්‍රී ලංකාවේ වගකීම්සහගත භාවයේ ඌනතාවය නිසා ඇති වූ එක් තීරණාත්මක ප්‍රතිඵලයක් වන්නේ, එල්ටීටීඊය විසින් (මෙන්ම සෙසු සන්නද්ධ කල්ලි විසින් ද) සිදුකළ අපහරණයන් නීති අධිකරණයකදී සලකා නොබැලීමයි.

එල්ටීටීඊ යට එරෙහි අරගලය (ගතවූ දශක හතර මුළුල්ලේ ශ්‍රී ලංකාව විනාශ කළ බරපතළ දේශපාලන අර්බුද සහ සන්නද්ධ අරගල මාලාවක අවසානය වූ) විසින් ශ්‍රී ලංකාව පුරාම මානව හිමිකම්වල තත්වය පහත වැටීම සඳහා වැඩි වශයෙන් පසුතලය සැකසූ අතර නියත වශයෙන්ම එයට අවශ්‍ය පහසුකම් සපයා දුන්නේය. නමුත් අරගලය අවසාන වීම විසින් ශ්‍රී ලංකාවේ වගවීම හෙවත් වගකීම ට යටත්වීම කුමන හෝ ආකාරයකින් වැඩි දියුණුවීමක් සිදුවනු ඇත යනුවෙන් පැවති සෑම බලාපොරොත්තුවක්ම මේ වන විට බිඳවැටී තිබේ. සැබවින්ම සන්නද්ධ අරගලයේ අවසන් අදියර "ලේ වැකුණු සංහාරයක්" ලෙස විදහා දැක්වෙනුයේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුදා විසින් හමුදා දෙක අතරට මැදිවූ සිවිල් වැසියන් මිලියන කාලකට අධික පිරිසක් සමග ද්‍රවිඩ කොටින් ව සීඝ්‍රයෙන් භූමි ප්‍රමාණයෙන් කුඩා වන සීමා සහිත අවකාශයක් වෙත පසුබැස්සවීම නිසා ය. සිවිල් වැසියන් දස දහස් සංඛ්‍යාවක් මෙහිදී තුවාළ ලැබීම හෝ මියයාම සිදුවිය. දහස් ගණනක් 'අතුරුදන්' වූහ. රට තුළින් සහ රටෙන් පිටත නැගුණු උද්ඝෝෂණ හෝ ජන රාවය නොතකා අද දක්වාම මේ වින්දිතයන් හෝ මෙකී අති මහත් විනාශයෙන් දිවිබේරාගත්තවුන් පිළිබඳ වගවීමක් නැත.

ඉතා පැහැදිලිව ම වගවීමේ යාන්ත්‍රණයක් නොවන සහ විධිනියෝගයෙන්, සාමාජිකත්වයෙන් සහ මෙහෙයවීම යන අංශවලින් සදෝෂී යැයි පුළුල් සහ නිවැරදි ලෙස විවේචනයට ලක්වූ උගත් පාඩම් සහ සංහිඳියා කොමිසමක් (Lessons Learned and Reconciliation Commission-LLRC) ස්ථාපිත කිරීම මගින්, යුක්තිය ඉටුකරන ලෙස නැගුණු ඉල්ලීම් විසරණය කර දැමීමට ශ්‍රී ලංකා ආණ්ඩුව උත්සාහ කළේය. තවද "එබඳු සිදුවීම් (මානව හිමිකම් නීතිය සහ යුධ නීති උල්ලංඝනයන්) සිදුවූයේ කුමන තත්ව යටතේ ද යන්න වඩාත් සම්පූර්ණ ලෙස සොයාදැනගැනීමට සහ එබඳු විමර්ශනවලින් වරදකාරී කල්ක්‍රියාවක් හෙළිදරව් වේ නම් වරදකළවුන් නීතිය ඉදිරියට පැමිණවීමට සහ ඔවුන්ට දඬුවම් ලබාදීමට රජයේ පාර්ශවයෙන් යුතුකමක් තිබේ"යැයි එම කොමිසම විසින් පවා නිගමනය කළේය. ස්වාධීන අධිකරණයක, විනිවිද භාවයෙන් යුතු නෛතික ක්‍රියාදාමයක සහ නීතියේ ආධිපත්‍යය වෙත දැඩි බද්ධතාවයකින් යුතු වීමේ අවශ්‍යතාවය ද උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම විසින් අවධාරණය කළේ, රටේ සාමය ස්ථාපිත කිරීමත් පවත්වාගෙන යාමත් එසේම රටේ චිරස්ථායිතාවය ස්ථාපිත කළ යුතු බවත් සඳහන් කරමිනි. මෙම නිර්දේශ අද දක්වා ද ඉටු කර නැත.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ නොනැමෙන ස්වභාවය සහ වගවීමක් සැපයීම ප්‍රතික්ෂේප කිරීම මත අන්තර්ජාතික ප්‍රජාව එම අභියෝගයට ප්‍රතිචාර දැක්වූයේ ශ්‍රී ලංකාවේ තත්වය විමර්ශනය ආරම්භ කිරීම සඳහා


එක්සත් ජාතීන්ගේ මහ ලේකම් වෙත ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ විශේෂ විශේෂඥ උපදේශන මණ්ඩලයක් කැඳවමිනි. අරගලයේ දෙපාර්ශවයටම දෝෂාරෝපණය කරමින් ප්‍රතිඵල වූ එහි වාර්තාව මගින්, අපරාධකරුවන් වගවීමට ලක්කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ක්‍රමානුකූල අපොහොසත් වීම සහ ශ්‍රී ලංකාවේ වගවීමේ යාන්ත්‍රණයන්හි දුර්වලතා ද හුවාදැක්වූ අතර වඩාත් තීරණාත්මක ලෙස, රටේ අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වයේ ඌනතා සහ අපක්ෂපාතිත්වය පිළිබඳ ගැටලු ද හුවා දැක්වීය.



සැබවින්ම සන්නද්ධ අරගලයේ අවසන් අදියර "ලේ වැකුණු සංහාරයක්" ලෙස විදහා දැක්වෙනුයේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුදා විසින් හමුදා දෙක අතරට මැදිවූ සිවිල් වැසියන් මිලියන කාලකට අධික පිරිසක් සමග ද්‍රවිඩ කොටින් ව සීඝ්‍රයෙන් භූමි ප්‍රමාණයෙන් කුඩා - සීමා සහිත අවකාශයක් වෙත පසුබැස්සවීම නිසා ය.

## රිසානා නෆීක් අංක 1

# ඇය බේරාගන්නට බැරි විය.




*2013 ජනවාරි 9 දා සෞදි වධකයන් ඇගේ ගෙළ කපා මරා දමන තෙක් ශ්‍රී ලංකාව නිදා සිටියේද? වයස අවුරුදු 17 දී සිරගත කර වයස 25 එළඹෙන තෙතක් සිරභාරයේ තබාගත් ඇයට නඩු විභාගයේ කිසිදු අවස්ථාවකදී නීතිඥ සහායක් ලැබී තිබුණේ නැත. තමන්ට අඩන්තේට්ටම් කිරීමෙන් පසුව පාපොච්චාරණක් ලබාගත් බවත් රිසානා එක් අවස්ථාවක කියා සිටියාය. රිසානාගේ ගෙළ කපා මරා දමන දින ද ඇය පිළිබඳ පාර්ලිමේන්තුවේ කතා කෙරිණි. ඒ වන විට අගවිනිසුරුවරිය, ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මිය එළවා දමා දිවි නැගුම සම්මත කර ගැනීමේ බලවත් කුලප්පුව ආණ්ඩුවට වැළඳී තිබූ නිසා ශ්‍රී ලංකාවේ අසරණ දැරියක කෲර සහ අමානුෂික ලෙස මරා දමන්නට යන බව ඔවුන්ට සහමුලින්ම අමතක වී ගියේය. රිසානා ට මරණ දණ්ඩනය ලබාදීමෙන් පසු මහා වීරකමක් කරනවාක් මෙන් රියාද් නුවර සිටි ශ්‍රී ලංකා තානාපතිවරයා මෙරටට ගෙන්වා ගත්තේය. පසුව රිසානාගේ දුගී මව අරලියගහ මන්දිරයට ගෙන්වා ඇයට ජනාධිපතිවරයා ලක්ෂ කිහිපයක් දුන්නේය. පසුව ආණ්ඩුව හිසේ ඇම්මට තවදුරටත් කොට්ට මාරුකළේ වයස අවුරුදු 25 න් මෙපිට කිසිම ගැහැනු ළමයෙකුට පිටරට යන්නට බැරි වන ලෙස නීතිය වෙනස් කරමිනි.*

# රිසානා නෆීක් මරා දැමීම - සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ අතයි.

*- ආසියානු මානව හිමිකම් කොමිසම කියයි.*

> රිසානා මරා දැමුණු දිනය ලජ්ජාවේ දිනයක් ලෙස සියලු ශ්‍රී ලාංකිකයන් විසින් සලකා ඒ පිළිබඳ පසුතැවිය යුතු වේ.
>
> රිසානාගේ මරණ දණ්ඩනය මෙතරමකින් හෝ ප්‍රමාද වූයේ ආසියානු මානව හිමිකම් කොමිසමේ පරිශ්‍රමයන් මගින් ගොනුකළ අභියාචනක් නිසා ය. ජනාධිපති මහින්ද රාජපක්ෂ ගේ ආණ්ඩුවෙන් කොතෙක් ඉල්ලීම් කළද අභියාචනය ගොනු කළ නීතිඥයන්ගේ ගාස්තුව පවා ගෙවීම ආණ්ඩුව ප්‍රතික්ෂේප කළේය.

2005 වර්ෂයේ සෞදි රාජ්‍යයේ මෙහෙකාර සේවයට ගිය රිසානා නෆීක් එයට සතියකට පසු නිවසේ අතදරුවාට බෝතලයෙන් කිරි පෙවීමේදී කිරි සිරවීම නිසා දරුවා මිය ගිය විට, මිනීමැරුම් චෝදනා ලැබුවාය. මේ මරණය සිදුවන විට උප්පැන්න සහතිකය අනුව ඇය බාලවයස්කාරියක වුවද ඇයට විරුද්ධ ව චෝදනා ගොනුකිරීමට සෞදි රජය කටයුතු කළේය. ඉන්පසුව වයස් පූර්ණත්වයට පත්වූ පසුව ඇගේ හිස ගසා දැමිණි. ඇය නිසි පරිදි රඳවා තබානොගත් බවට, නීතීඥ සහාය නොලැබීම පිළිබඳ සහ අඩන්තේට්ටම්වලට ලක්වීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රජාව නොයෙක් අවස්ථාවන්හිදී සිය අප්‍රසාදය පළ කළේය. මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මතයක් ඇති කරලීම සඳහා ආසියානු මානව හිමිකම් කොමිසම මහඟු සේවයක් ඉටු කළේය. Save Rizana ව්‍යාපාරය ගොඩනංවා ඇය නිදහස් කර ගැනීම උදෙසා අරගල කළේය. රිසානා ගේ මරණයෙන් පසු ආසියානු මානව හිමිකම් කොමිසම විශේෂ ප්‍රකාශයක් නිකුත් කරමින්, ආණ්ඩුවේ පාර්ශවයෙන් සහ විශේෂයෙන්ම ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පාර්ශවයෙන් සිදුවූ වැරදි සහ අතපසුවීම් රිසානාගේ මරණය සඳහා වගකිවයුතු බව සහේතුකව මෙසේ පැහැදිලි කළේය.

මේ අහිංසක, ළාබාල ශ්‍රී ලාංකික ස්ත්‍රියගේ මරණය සම්බන්ධ එකලා වගකීම ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත පැවරෙන බව පැහැදිලිව සඳහන් කිරීමට ආසියානු මානව හිමිකම් කොමිසම බලාපොරොත්තු වෙයි. 2005 මැයි මස සිට විදේශයක සිරගත කර සිටි මේ අහිංසක ශ්‍රී ලාංකික ස්ත්‍රිය ඔහු සහ ඔහුගේ ප්‍රධානත්වයෙන් මෙහෙයවෙන ආණ්ඩුව විසින් දිගින් දිගටම ලැජ්ජා විරහිත ලෙස නොතකා හැරියේය. චෝදනා ලත් අපරාධය සිදුවන විට ඇගේ වයස අවුරුදු 17 ක් පමණක් වූ අතර ඇයව නොපමාව සෞදි අධිකරණයක් විසින් මරණ දණ්ඩනයට නියම කෙරිණි. රිසානාගේ පවුලේ අය සහ ලෝක සිවිල් සමාජය විසින් සිදුකරන ලද ඉල්ලීම් නොතකා ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ ජනාධිපති කාර්යාලය රිසානාගේ ජීවිතය බේරාගැනීම සඳහා කිසිවක් නොකළේය.

රිසානා මරා දැමුණු දිනය ලජ්ජාවේ දිනයක් ලෙස සියලු ශ්‍රී ලාංකිකයන් විසින් සලකා ඒ පිළිබඳ පසුතැවිය යුතු වේ.

රිසානාගේ මරණ දණ්ඩනය මෙතරමකින් හෝ ප්‍රමාද වූයේ ආසියානු මානව හිමිකම් කොමිසමේ පරිශ්‍රමයන් මගින් ගොනුකළ අභියාචනක් නිසා ය. ජනාධිපති

මහින්ද රාජපක්ෂ ගේ ආණ්ඩුවෙන් කොතෙක් ඉල්ලීම් කළද අභියාචනය ගොනු කළ නීතීඥයන්ගේ ගාස්තුව පවා ගෙවීම ආණ්ඩුව ප්‍රතික්ෂේප කළේය.

සෞදි නීතියට අනුව බලහත්කාරයෙන් පාපොච්චාරණයක් ලබාගැනීම සාපරාධී වරදකි. මේ ගැටලුව සම්බන්ධයෙන් ආසියානු මානව හිමිකම් කොමිසම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයා ව නොකඩවා දැනුවත් කළේය. එසේවුවත් මහකොමසාරිස්වරයා පවා මේ අහිංසක කාන්තාවගේ ජීවිතය බේරාගැනීමට අපොහොසත් විය.

රිසානා ට එරෙහිව නැගුණු මිනීමැරුම් චෝදනාව සාවද්‍ය බව ට සැකයක් නැත. අපරාධ විමර්ශනය සම්බන්ධයෙන් විශ්වීය වශයෙන් පිළිගත් සංකල්පවලට වඩා සෞදි අරාබියේ නීතිය පවතින්නේ පිටුපසිනි. විශේෂයෙන්ම මේ සිද්ධියේදී රිසානා විසින් මරාදැමුවේ යැයි කියන පුද්ගලයාගේ මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයකට ලක් කිරීමට අපොහොසත් ව තිබේ. රිසානා ට විරුද්ධ ව නඩු ඇසෙන විට සාධාරණ නඩු විභාගයන් පිළිබඳ කිසිදු රක්ෂණයක් ද නොතිබුණේය.

සියලු ශ්‍රී ලාංකිකයන් මෙන්ම ලොව පුරා සිටින රිසානා බේරාගැනීම සඳහා මැදිහත් වූ පිරිස ද රිසානා ට මරණ දණ්ඩනය ලබාදුන් පුවත අසන්නට ඇත්තේ මහත් කම්පනයෙනි. ඇස්තමේන්තු ගත කර ඇති පරිදි ශ්‍රී ලාංකිකයන් මිලියන 1.8 ක් විදේශයන්හි සේවය කරන අතර එයින් 45% කාන්තාවන් ය.

මෙම කණගාටුදායක-කම්පිත අවස්ථාවේදී ආසියානු මානව හිමිකම් කොමිසම සිය බලවත් ශෝකය රිසානාගේ පවුල වෙත ප්‍රකාශ කරයි. රිසානා බේරාගැනීමට ඔවුන්ට ආණ්ඩුවේ සහාය ලැබුණේ නැත.

ආණ්ඩුව සිය ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ සැලකිලිමත් නොවන තාක් කල්, මෙවැනි ඛේදවාචකයන් නැවත නැවතත් සිදුවනු ඇත."

---

## රිසානා නෆීක් අංක 2





# සුදේශ්කර් මරා දැමීමද..?

*රිසානා නෆීක් මරණ දණ්ඩනයට ලක් කර නොබෝ දිනකින් එම ඉරණම ට ම ලක් වන්නට නියමිතව සිටින දමිළ ජාතික තරුණයෙකු වන වෙන්ගඩසලාම් සුදේශ්කර් පිළිබඳ කරුණු හෙළිවිය. රිසානා සිද්ධියෙන් සුදේශ්කර් ගේ සිද්ධියෙන් ප්‍රධාන වශයෙන් වෙනස් වනු ඇත්තේ ඔහු බාලවයස්කරුවෙකු නොවීම හා 'බ්ලඩ් මනි' පිළිගැනීමට දෝහා කටාර් හි අදාළ පවුලේ ඥාතීන් එකග වීමය. බ්ලඩ් මනි ලෙස හඳුන්වන මුදල ගෙවීමට අදාළ චූදිතයා සමත් වුවහොත් ඔහු ට සමාව ලැබේ. සුදේශ්කර් වෙනුවෙන් ඉල්ලා සිටින මුදලින් ආසියානු මානව හිමිකම් කොමිසම අවස්ථා දෙකකදී රුපියල් ලක්ෂ හයක් ප්‍රදානය කළේය. පාර්ලිමේන්තු මන්ත්‍රී රංජන් රාමනායක මහතා රුපියල් ලක්ෂයක මුදලක් ප්‍රදානය කළේය. EAP සමූහ ව්‍යාපාරය සහ නවලෝක එන්ටර්ප්‍රයිසස් රුපියල් ලක්ෂය බැගින් ප්‍රදානය කළෝය. සුදේශ්කර්ගේ පවුලේ හිතවතුන් හා නෑසියන් එක්ව තවත් ලක්ෂ 35 ක මුදලක් සොයාගෙන තිබේ. මෙයට සුදේශ්කර්ගේ මව විසින් ඔවුන් සතු සියලු දේපළ සහ කණකර අබරණ විකිණීමෙන් ලබාගත් රුපියල් ලක්ෂ 10 ක පමණ මුදලක් ද අයත් ය. කෙසේ නමුත් පෙබරවාරි*


*19 දා වන විට තවත් රුපියල් ලක්ෂ 6 ක මුදලක් සුදේශ්කර් බේරාගැනීම සඳහා අවශ්‍ය ව තිබුණේය. සුදේශ්කර්ගේ මව වන මංගලා සාමි, දෝහා හිදී හිස ගසා දැමීමට නියමිතව සිටින සිය පුතාගේ ජීවිතය බේරාගැනීම සඳහා ඉතිරි මුදල ලබාදෙන මෙන් ආයාචනය කළාය. ආසියානු මානව හිමිකම් කොමිසම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති අමල් සේනාධිලංකාර වෙත ආරම්භයේ පටන්ම මෙම ගැටලුව වෙත මැදිහත් වන ලෙස ඉල්ලීම් කළ ද ප්‍රතිචාරයක් ලැබුණේ නැත. ඒ අනුව අවසානයේ ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙත ද මෙම ඉල්ලීම ඉදිරිපත් කෙරිණි. ආණ්ඩුව කරන්නට යන්නේ රිසානා මෙන්ම සුදේශ්කර් ද මරා දැමුණු පසු ඔහුගේ ඥාතීන් ජනපති මැදුරට ගෙන්වා මුදල් ටිකක් දී පව් සෝදා ගන්නද...???*

---




**හිරු, සඳු සහ සත්‍යය**

**කිසිදා සැඟවිය නොහැක.**




# What Men Live By

## by Leo Tolstoy

### I

තමන්ගේ කියා ගෙයක් හෝ ඉඩමක් නැති සයිමන් නමැති සපතේරුවෙක් සිය භාර්යාව සහ දරුවන් සමග ගැමියෙකුගේ පැල්පතක ජීවත් විය. සපත්තු මසමින් ජීවිකාව ගෙන ගියේය. රක්ෂාව ලාභ වුවද පාන් මිල අධික විය. උපයන සියල්ල ඔහු කෑම සඳහා වැය කළේය. ඔහු සහ ඔහුගේ බිරිඳ යන දෙදෙනාටම ශීත සෘතුවේදී අඳින්නට තිබුණේ බැටලු සමෙන් කළ එක් කබායක් පමණකි. එයද වැරහැලි වෙලාය. නව කබායක් මැසීම සඳහා බැටලු සම් මිලදී ගැනීමට ඔහුට උවමනා වී තිබෙන දෙවැනි වසර මෙයයි. ශීත සෘතුවට පෙර සයිමන් මුදල් ස්වල්පයක් ඉතිරි කර ගත්තේය. එම රූබල් තුනේ නෝට්ටුව ඔහුගේ බිරිඳගේ පෙට්ටගමේ සඟවා ඇති අතර ගම්මානයේ ගැනුම්කරුවන් ඔහුට රූබල් පහයි කොපෙක් විස්සක් ණයගැති ය.

ඉතින් එක් උදෑසනක ඔහු බැටලු සම් මිලදී ගැනීම සඳහා ගම්මානයට යන්නට ලැහැස්ති විය. කමිසයට උඩින් සිය බිරිඳගේ කහපාට කපු රෙදි ජැකට්ටුව හැඳගෙන එයට උඩින් සිය රෙදි කබාය හැඳගත්තේය. රූබල් තුනේ නෝට්ටුව සිය පොකට්ටුවේ දමාගෙන, රිටක් සේ භාවිතා කළ හැකි දණ්ඩක් කපාගෙන, පාතරාසය ගැනීමෙන් පසුව ගමන පිටත් විය. "මට ලැබෙන්න තියෙන රූබල් පහ මම එකතු කර ගන්නවා" යැයි ඔහු සිතුවේය. "ඒකට ළඟ තියෙන රූබල් තුනත් එකතු කර ගත්තම බැටලු හම් ගන්න සල්ලි ඇති."

ඔහු ගම්මානයට පැමිණ ගම්වැසියෙකුගේ පැල්පතක් ළඟට ගොස් ඇමතීය. නමුත් ගැමියා ගෙදර නොසිටියේය. මුදල් ලබන සතියේ ගෙවන බවට ගැමියාගේ පවුල පොරොන්දු විය. නමුත් මේ වේලාවේ එය ගෙවීමට

පුළුවන්කමක් නැත. සයිමන් තවත් ගම්වැසියෙකු වෙත ගියේය. තමන් ළඟ මුදල් නැතැයි ඔහු දිවුරුවේය. මේ වේලාවේ ඔහුට ගෙවන්නට පුළුවන්කම තිබෙන්නේ සයිමන් විසින් මසා දුන් බූට් සපත්තු දෙකේ කුලිය වශයෙන් කොපෙක් විස්සක් පමණකි. ඉන්පසු සයිමන් බැටලු සම් ණයට ගැනීමට වෑයම් කළේය. නමුත් වෙළෙන්දා ඔහුව විශ්වාස නොකළේය.

''මුලින් නුඹේ සල්ලි ගෙනෙන්." ඔහු කීය. "ඊට පස්සෙ පුළුවන් බැටලු හම් ගන්න. අපි දන්නවා ණය එකතු කිරිල්ලෙ රඟේ..." මේ අනුව මේ ගමනෙන් සපතේරුවාට ලැබුණේ බූට් සපත්තු දෙකක් මැසීම වෙනුවෙන් කොපෙක් විස්සක් සහ ගම්වැසියෙක් දුන් තනිකරම සම්මුවා බූට් සපත්තු දෙකක් පමණකි.

සයිමන් මහත් අධෛර්යයට පත්විය. කොපෙක් විස්ස වොඩ්කා බොන්නට වැයකළ ඔහු කිසිම බැටලු සමක් නැතිව ගෙදර යන්නට පිටත් විය. එදින උදෑසන ඔහුට ශීතල දැනුණත් දැන්, වොඩ්කා බීමෙන් පසු බැටලු හම් කබාය නැතිවත් ඔහුට උනුසුමක් දැනේ. හිම මිදුණු පොළොවට සැරයටියෙන් බර දෙන ගමන්, අනෙක් අතින් පැද්දෙන හම් සපත්තු අල්ලාගෙන වැනෙමින් යන ගමන් ඔහු තමන්ට සමගම කතා කළේය.

''මට හොඳ රස්නෙයි.. බැටලු හම් කබා නැතිවට... මම අඩියක් ගැහුවා... ඒක මගෙ නහර දිගේ දුවනවා. මට බැටලු හම් ඕනෙ නෑ. මම දිගටම යනවා.. කිසි දුකක් නෑ.. අන්න ඒ ජාතියෙ මිනිහෙක් මං! මම මොනව ගැන වදවෙන්නද..? බැටලුහම් නැතිවට මං මැරෙන්නෑ. මට ඒව එපා... මගෙ ගෑනිට නම් ආයෙ දෙකක් නෑ තරහ යයි. ඇත්ත තමයි, ඒක ලැජ්ජාවක්. දවස පුරාම වැඩ කරලත් පඩියක් නැතිකොට.. පොඩ්ඩක් හිටපන්.. ඒ සල්ලි අරං ආවෙ නැතිනම් මම උඹව හම ගහනවා.. කොහොමද ඒක..? මිනිහ මට කොපෙක් විස්සක් දුන්නා! මට කොපෙක් විස්සකින් මොනවද කරන්න පුළුවන්..? බොන එක.. එච්චරයි කරන්න පුළුවන්. වෙන කරන්න දෙයක් නෑ.. කියල මිනිහ කිව්වා. එහෙම වෙන්න පුළුවන! එතකොට මට...? උඹට ගෙදරක් තියෙනවා. හරක බාන ඉන්නවා. හැම දේම තියෙනවා. මට තියෙන්නෙ මේ හිටගෙන ඉන්න ටික විතරයි! උඹ ළඟ උඹම වැව්ව තිරිඟු තියෙනවා. මම තිරිඟු ඇටයක් ගානෙ සල්ලිදීල ගන්න ඕනෙ.. මම මොකද කරන්නෙ..? පාන්වලට විතරක් හැම සතියකම රූබල් තුන ගානෙ වියදම් කරන්න ඕනෙ. මම ගෙදර එද්දි පාන් ඔක්කොම ඉවරයි. එතකොට එහෙ මෙහෙ අවුස්සල තව රූබල් එකහමාරක් හොයාගන්න ඕනෙ.. ඉතින් උඹේ ණය ගෙවල දාපන්. ඒ ගැන විකාර එපා..!

මේ වන විට ඔහු වංගුව අද්දර තිබෙන පල්ලිය අසලට පැමිණ සිටියේය. උඩ බලන විට ඔහු දුටුවේ යම්කිසි සුදුපාට දෙයක් පල්ලියට හේත්තු වී ඇති බවය. දිවා ආලෝකය වියැකී යමින් තිබුණේය. සපතේරුවා ඒ සුදු පැහැති යම්කිසි දෙය හඳුනාගත නොහැකිව ඒ දෙස එබි එබී බැලුවේය. "මෙතන මීට කලින් සුදුපාට ගල් පර්වතයක් තිබුණෙ නෑ. මේක ගොනෙක් වෙන්න බැරිද? නෑ ගොනෙක් වගේ නෙවෙයි. ඔළුව නිකම් මිනිහෙකුගෙ වාගෙයි. ඒත් මෙච්චර සුදුවට..? අනෙක මිනිහෙක් මොකක්ද මෙතන කරන්නෙ?

ඔහු තව ටිකක් ළං විය. එවිට එය වඩාත් පැහැදිලිව පෙනිණ. ඔහුගේ පුදුමයට හේතුවෙමින් ඒ සිටියේ මිනිසෙකි. ජීවත් ව සිටිනා හෝ මළවුන් අතර සිටිනා මිනිසෙකි. නිරුවතින් වාඩිවී සෙළවෙන්නේවත් නැතිව පල්ලියට හේත්තු වී සිටගෙන සිටියේය. සපතේරුවා භ්‍රාන්ත විය. මෙසේ සිතුවේය. කවුරු හරි මිනිහව මරලා, ඇඳුම් ගලවල මෙතන දාල ගිහින්. මම මේකට ඇඟිලි ගහන්න ගියොත් මම කරදරේ වැටෙයි."

එනිසා සපතේරුවා එතැනින් ගියේය. ඔහු පල්ලිය පසුකර ගියේ ඉදිරිපසිනි. එවිට අර සුදු නිරුවත් මිනිසා ඔහුට නොපෙනෙයි. ටික දුරක් ගිය ඔහු ආපසු හැරී පල්ලිය දෙස බැලුවේය. එවිට ඔහු දුටුවේ අර මිනිසා තවදුරටත් පල්ලියට හේත්තු වී නොසිටින බවයි. ඒ වෙනුවට සපතේරුවා දෙස බලමින් ඔහු වෙත එන බවක් පෙනුණේය. සපතේරුවාට පෙරටත් වඩා බය හිතුණේය. ඔහු මෙසේ සිතුවේය. "මම ඔහු ළඟට යන්නද නැතිනම් දිගටම යන්නද? මම ඒ මිනිහ ළඟට ගියොත් මොනව හරි භයානක දෙයක් මට සිද්ධ වෙයි. කවුද දන්නෙ මිනිහ කවුද කියලා..? හොඳකට ආව නම් වෙන්න බෑ.. මම මිනිහ ළඟට ගියොත් මිනිහ මගෙ ඇඟට පනියි. එහෙම වුණොත් ගැළවෙන්න ලැබෙන්නෙ නෑ.. හෙළුවැල්ලෙන් ඉන්න මිනිහෙක් එක්ක මම මොනව කරන්නද? මට පුළුවනෑ මගේ අවසාන ඇඳුම මිනිහට දෙන්න? මාව මේ කරදරෙන් ගළවගන්න පුළුවන් දෙයියන්ට විතරයි..!"

එනිසා සපතේරුවා පය ඉක්මන් කළේය. නමුත් හදිසියේම ඔහුගේ හෘදය සාක්ෂිය ඔහුව යටත් කර ගත්තේය. ඔහු පාර මැද නතර වුණේය.

''සයිමන්.. උඹ මොනවද මේ කරන්නෙ?" ඔහු තමාගෙන්ම ඇසුවේය. "අර මිනිහ අතන උදව් ඕනෙ වෙලා මැරෙන්න යනව වෙන්න පුළුවන්. හැබැයි උඹ බයෙන් ලිස්සල යනවා. ඇයි උඹ හොරුන්ට බය වෙන්න තරම් මහ පෝසතෙක්ද? අහා.. සයිමන්.. උඹ ගැන ලැජ්ජයි.."

එනිසා ඔහු ආපසු හැරී අර මිනිසා වෙත ගියේය.

*ලබන කලාපයට...*

# නමක් නැති මිනිස්සු

- බැසිල් ප්‍රනාන්දු



අපි
නමක් නැති මිනිසුන් වෙමු
නැත ඡායාරූප
නැත සිත්තම්
වාර්තාගත කිරීමට අපේ අතීතයන්
අපේ ආදි පියවරු
මුද්දර එකතු නොකළහ
නොමැත පොදු ප්‍රාකාරයක්
අපේ නම් රැඳුණු
සම්මාන නැත අපට
ප්‍රකට ක්‍රීඩාවන්හිදී

අපි
නමක් නැති මිනිසුන් වෙමු
අපේ ආදි පියවරු ද වූහ එවැනි ම
දුක්ඛයන්ගේ යුගයන් විසින්
සබඳියි අප ව අතීතය ට
ස්මරණයන් නැත අපගේ
නමුත් අප ලොව අපරිමාණ ය.

අපි
නමක් නැති මිනිසුන් වෙමු
වෙස්මුහුණ අපගේ නිහැඬියාවයි.